වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

2025

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

தேசிய திட்டமிடல் திணைக்களம்

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Department of National Planning
Ministry of Finance, Planning and Economic Development

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 237

පිටු අංකය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය **3**

1.1 හැඳින්වීම 3
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3 ප්‍රධාන කාර්යයන් 4
1.4 සංවිධාන සටහන 5
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන/අරමුදල් 6
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) 6

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **8**

2.1 සමාජීය යටිතල පහසුකම් 8
2.2 කෘෂිකර්ම 11
2.3 කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක 16
2.4 වානිජ යටිතල පහසුකම් 19
2.5 පාලනය 23
2.6 පරිසර කළමනාකරණය 24
2.7 සමාජ ආරක්ෂණ 26
2.8 ප්‍රාදේශීය සංවර්ධනය 28

03 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය **29**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 29
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 30
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 31
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 32
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ 33
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 33
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 33
3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය 34
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 34

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **35**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 35

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය **36**

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 36
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 36

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ **37**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 37
6.2 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහ කාර්ය සාධනය අතර සම්බන්ධතාවය 37
6.3 මානව සම්පත් සංවර්ධනය 37

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **48**

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර, රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලදී. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර, සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර, එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම

අරමුණු

1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම
2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇගයීම, අනුමැතිය සහ නිර්දේශ සැපයීම
- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම හා රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය
- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම
- ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම
- අවශ්‍ය විටෙක ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට පහසුකම් සැපයීම
- විශේෂ/ ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- අවශ්‍ය විටෙක නව සැලසුම් ක්‍රම යොදා ගැනීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා සහයවීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- අවශ්‍ය විටෙක කාලීන ගැටළු පිළිබඳ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

1.4 ආයතනික සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලීම පිණිස දෙපාර්තමේන්තුව අංශ 8 කට වෙන් කර ඇත. එම අංශ 8 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ වලට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීම, රාජ්‍ය ආයෝජන ප්‍රතිපත්තිය සැකසීම, ප්‍රතිපත්ති සැකසීම සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත සහයෝගය ලබා දීම සහ අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ අංශ

- සමාජීය යටිතල පහසුකම්
- කෘෂිකර්ම
- කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක
- වානිජ යටිතල පහසුකම්
- පාලනය
- පරිසර කළමනාකරණ
- සමාජ ආරක්ෂණ
- ප්‍රාදේශීය සංවර්ධන

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන /අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

(a)

1. **ව්‍යාපෘතියේ නම :** ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය
2. **ආධාර දෙන ආයතනය :** ආසියානු සංවර්ධන බැංකුව
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය :** රු. මිලියන: 74,023* (ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 203.36)
4. **ව්‍යාපෘති කාලය :** 09.09.2022 – 29.08.2026

* ව්‍යාපෘති කාලය ආරම්භයේ විනිමය අනුපාතය වන රු. 364 සලකා ඇත.

(b)

1. **ව්‍යාපෘතියේ නම:** වෙළඳපල සන්ධානය හරහා ස්වයං පාලනය, සාක්ෂරතාවය සහ අවධානය ප්‍රවර්ධනය කිරීමේ (PALAMA) ව්‍යාපෘතිය - අදියර II

2. **ආධාර දෙන ආයතනය:** ඇමරිකා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 10,400

4. **ව්‍යාපෘති කාලය:** 2024 - 2028

(c)

1 **ව්‍යාපෘතියේ නම:** ආර්ථික වර්ධනය සඳහා වන යහපාලන වැඩසටහන

2. **ආධාර දෙන ආයතනය:** ඕස්ට්‍රේලියානු රජය

3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 11,250

4. **ව්‍යාපෘති කාලය:** 2021 - 2031

(d)

1 **ව්‍යාපෘතියේ නම:** ඵලදායී රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය

2. **ආධාර දෙන ආයතනය:** ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA)

3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 179.19

4. **ව්‍යාපෘති කාලය:** 2021 – 2025.12.31

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආංශීය වශයෙන් ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සමාජීය යටිතල පහසුකම්

අධ්‍යාපනය

රටේ ආර්ථික හා සමාජීය ප්‍රගතිය සඳහා මානව සම්පත් සංවර්ධනය තවදුරටත් කේන්ද්‍රීය සාධකයක් ලෙස පවතී. පුද්ගල වර්ධනයට සහ අර්ථවත් සමාජ දායකත්වයක් ලබා දීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්පවලින් පුද්ගලයන් සන්නද්ධ කිරීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අරමුණයි.

2025 වසරේදී ක්‍රියාත්මක කරන ලද විෂයමාලා නවීකරණය, ගුරු වෘත්තීය සංවර්ධනය, පාසල් තර්කාපණය, ඩිජිටල් ඉගෙනුම් මූලාරම්භයන් සහ ශක්තිමත් කරන ලද ඇගයීම් යාන්ත්‍රණයන් ඇතුළු ප්‍රධාන පාසල් මට්ටමේ ප්‍රතිසංස්කරණ මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය තවදුරටත් ඉහළ නංවන ලදී. මෙම ප්‍රතිසංස්කරණ, ඉහළ සහභාගිත්ව අනුපාතයක් සහිතව පවත්වා ගැනීමට සහ පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට දායක වූ අතර, ප්‍රාථමික හා කනිෂ්ඨ ද්විතීයික බඳවා ගැනීම් සහ රඳවා ගැනීම් ශක්තිමත්ව කිරීම මගින් තිරසාර ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සහ ආයෝජනයන්හි ඵලදායීතාවය පිළිඹිබු කරයි.

පාසල් මට්ටමින්, විෂයමාලා, ඇගයීම් සහ උපදේශන ප්‍රතිසංස්කරණවල බලපෑම පිළිබිඹු කරමින් අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල මධ්‍යස්ථ මට්ටමේ දියුණුවක් දක්නට ලැබුණි. පන්ති කාමර, සනීපාරක්ෂක පහසුකම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ ඩිජිටල් ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීම සහ ශිෂ්‍ය සුබසාධන වැඩසටහන් ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් මගින් ඉගෙනුම් පරිසරය ඉහළ නැංවීමට සහ සමාන ප්‍රවේශ අවස්ථා ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

ජාතික ආර්ථික හා සමාජ සංවර්ධනයේදී ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රම බලකායක තීරණාත්මක කාර්යභාරය හඳුනා ගනිමින්, රජය විසින් වෘත්තීය, තාක්ෂණික සහ ඩිජිටල් කුසලතා නංවාලීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත. ඒ අනුව, කුසලතා වර්ධනය (skilling), නැවත කුසලතා ලබා දීම (re-skilling) සහ කුසලතා ඔප්නැංවීමට (up-skilling) අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම, ජීවිත කාලය පුරාම ඉගෙනීම දිරිමත් කිරීම, අපනයන අභිමුඛ කර්මාන්ත සඳහා සහාය වීම සහ රට හරිත හා ඩිජිටල් ආර්ථිකයක් කරා සංක්‍රමණය වීම වේගවත් කිරීම සඳහා පියවරයන් ගෙන ඇත.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, STEM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය) සහ වෘත්තීය වැඩසටහන් පුළුල් කිරීම, ගුණාත්මක තත්ත්ව සහතික කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාදක ඉගෙනීම සහ ඉලක්කගත ශිෂ්‍යත්ව ක්‍රම වැනි 2025 දී හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ මගින් උපාධිධාරීන්ගේ රැකියා සඳහා සූදානම වැඩි දියුණු කිරීමට සහ ජාතික හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සමඟ වඩා හොඳින් අනුකූල වීමටත් හැකි වී ඇත.

මෙම ජයග්‍රහණ මධ්‍යයේ වුවද, මූලික විෂයයන්හි ඉගෙනුම් පරතරයන්, කලාපීය හා විෂය පදනම් කරගත් ගුරු හිඟය, යටිතල පහසුකම් විෂමතාවයන් සහ උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශ සීමාවන් ඇතුළු අභියෝග අධ්‍යාපනයේ සෑම මට්ටමකම පවතී. 2025 වසර සහ පෙර වර්ෂයන් තුළ කරන ලද ප්‍රතිසංස්කරණ හරහා ලබාගත් ජයග්‍රහණ තහවුරු කිරීම සඳහා ගුරුවරුන් යෙදවීම්, පිළියම් ඉගෙනුම් වැඩසටහන්, ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම්, වෘත්තීය පුහුණු (TVET) ආයතන ශක්තිමත් කිරීම සහ උසස් අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම සඳහා ඉලක්කගත මූල්‍ය සහාය අවශ්‍ය වේ. ජාතික සංවර්ධන අරමුණුවලට අනුකූලවෙමින් අධ්‍යාපනයේ ප්‍රගතිය තිරසාරව පවත්වා ගැනීමටත්, ඉගෙනුම් ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත්, ජාතික පොදු සම්පත් සාධාරණ හා කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහතික කිරීමටත් තවදුරටත් ප්‍රමුඛ හා අඛණ්ඩව මූල්‍ය සහාය අවශ්‍ය වේ.

ඉටු කරන ලද කාර්යයන්

- ඇගයීම සඳහා ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා 54 ක් නිසි පරිදි ඇගයීම සිදු කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුව / විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත.
- අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ කැබිනට් පත්‍රිකා 38 ක් සඳහා නිරීක්ෂණ සකස් කරන ලදී.
- අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් සංවිධානය කරන ලදී.
- විවිධ පාර්ශවයන් විසින් සකස් කර ඉදිරිපත් කරන ලද විවිධ වාර්තා/ලේඛන/සැලසුම් සඳහා අදහස්/නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

සියල්ලන් ඇතුළත් බව, නව්‍ය සහ තිරසාර සංවර්ධනය, මානව කේන්ද්‍රීය සහ මානව අයිතිවාසිකම් ආදී ඩිජිටල්කරණය තුළින් ශ්‍රී ලංකාව සවිබල ගැන්වීමේ දී, පදනම් වූ මූලධර්මයි. ආර්ථික ක්ෂේත්‍ර ඩිජිටල්කරණය රටේ සංවර්ධන ඉලක්ක කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීම එමගින් සහතික කරනු ඇත. ඒ අනුව, සම්බන්ධතාවය (connectivity) සහ ප්‍රවේශය (access), තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව, රාජ්‍ය කටයුතු ඩිජිටල්කරණය, ආරක්ෂාව, ඩිජිටල් මූල්‍යකරණය සහ ආර්ථික ක්ෂේත්‍ර ඩිජිටල්කරණය වැනි තේමාත්මක ක්ෂේත්‍ර 6ක් හරහා ආර්ථිකය ඩිජිටල් ආර්ථිකයක් කරා පරිවර්තනය කිරීමට රජය අපේක්ෂා කරයි. පෞද්ගලික ආයෝජන හරහා එම ප්‍රයත්නය දිරි ගැන්වෙනු ඇත. මේ අතරතුර, සයිබර් ආරක්ෂණ උපායමාර්ගය මගින් මහජනතාව සහ ආයෝජකයන් අතර විශ්වාසය සහ විශ්වාසභාවය වර්ධනය කරනු ඇත. දත්ත මධ්‍යස්ථාන පිහිටුවීම ඇතුළු, අනෙකුත් ඩිජිටල් ක්ෂේත්‍රයන්හි අවශ්‍ය පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කරනු ඇත.

නිම කරන ලද කාර්යයන්

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ ව්‍යාපෘති යෝජනා 11 ක් ඇගයීම් කර නිර්දේශ ලබා දෙන ලදී.
- අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 09 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.
- අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

විද්‍යාව සහ තාක්ෂණය

පර්යේෂණ සහ සංවර්ධන (R&D), නවෝත්පාදන, තාක්ෂණික දියුණුව ආර්ථිකයන්හි ආර්ථික වර්ධනය බහු ගුණයකින් ඉහළ යාමට හේතු වන ප්‍රධාන පරාමිතීන් වේ. එම පරාමිති මගින් ශ්‍රම බලකායේ නිපුණතා වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමට රටට හැකියාව ලැබේ. තාක්ෂණික නවෝත්පාදනයන්, දැනුම නිර්මාණය කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම ආදිය ආර්ථික පසුබෑම සහ ආර්ථිකයේ අනෙකුත් ගැටළු සඳහා විසඳුම් කරා ළඟා වීමට මාර්ග සහ විධි වේ. පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කරමින් පවතින අතර, අවශ්‍ය ස්ථානවලදී අවශ්‍ය දායකත්වයන් ලබා දී ඇත.

නිම කරන ලද කාර්යයන්

- පර්යේෂණ ව්‍යාපෘති ඇතුළුව ව්‍යාපෘති යෝජනා 21ක් ඇගයීම සිදු කර ඒවා නිර්දේශ කරන ලදී.
- අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.
- අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

සෞඛ්‍ය අංශය

ප්‍රාථමික සෞඛ්‍ය සේවා භාවිතය වැඩිදියුණු කිරීම, ද්විතීයික සෞඛ්‍ය සේවාවල සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, සෞඛ්‍ය සේවාවේ ඩිජිටල්කරණය සහ ඖෂධ සැපයුම් දාමයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම රජයේ සෞඛ්‍ය පද්ධතියේ ප්‍රධාන ප්‍රමුඛතා වේ. 2025 වර්ෂයේදී සෞඛ්‍ය අංශය සඳහා රජයේ ප්‍රධාන අරමුණු වූයේ රටේ මහජන සෞඛ්‍ය සේවාව වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ඖෂධ සහ සෞඛ්‍ය උපකරණ හිඟය වැළැක්වීමයි. ඒ අනුව, 2025 වර්ෂයේ දී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු, පළාත් සභා සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක වෙමින් පැවති සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. තවද, ජාතික සෞඛ්‍ය පද්ධතියට අපේක්ෂිත දායකත්වය ලබා ගැනීම සඳහා 2020 සිට අත්හිටුවා තිබූ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

2025 නොවැම්බර් අග සහ දෙසැම්බර් මුල දී ඇති වූ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ගංවතුර සහ නායයෑම් හේතුවෙන් රට පුරා සෞඛ්‍ය අංශයේ යටිතල පහසුකම්වලට විශාල හානියක් සිදු විය. මෙම බලපෑම් හේතුවෙන් දින කිහිපයක් සෞඛ්‍ය සේවා සැපයීම අඩාල විය. තවදුරටත් නායයෑම් සහ ගංවතුර තර්ජනය හේතුවෙන් තෝරාගත් ආයතනවල සේවාවන් විකල්ප ස්ථානවලට ගෙන යන ලදී. ඒ අනුව, හානිය තක්සේරු කිරීමට සහ සේවාවන් යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණය විය.

නිම කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති යෝජනා 35 ඇගයීම් සිදු කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. ඊට අදාල නිරීක්ෂණ අදාළ රේඛීය අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 06 ක් සඳහා නිරීක්ෂණ සපයා ඇත.
- සෞඛ්‍ය අංශය සඳහා ඉදිරි වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනා වී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක වන විදේශ ආධාර සපයන ව්‍යාපෘති වලට අදාලව රැස්වීම් පවත්වා අදාල නිරීක්ෂණ/ ලෝක සෞඛ්‍ය සංවිධානය , ලෝක බැංකුව , ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ආධාර සපයන ආයතන වල නියෝජිතයන් වෙත ඉදිරිපත් කිරීම.

විශේෂ ක්‍රියාකාරකම්

- 2026-2035 නව සෞඛ්‍ය සහ යහපැවැත්ම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ නිරත වීම.
- දිට්වා සුළි කුණාටුවෙන් බාධා එල්ල වූ සෞඛ්‍ය සේවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම.
- ව්‍යාපෘති ඉදිරිපත් කිරීම සඳහා නව ඩිජිටල් වේදිකාවක් පිළිබඳව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ක්‍රීඩා අංශය

සහභාගීත්වය පෝෂණය කිරීම, සහ සෞඛ්‍ය සම්පන්න, විනයගරුක සහ බුද්ධිමත් සමාජයක් හැඩගැස්වීම සඳහා ක්‍රීඩාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ජයග්‍රහණ තුළින් ජාතියකට ගෞරවයක් සහ අභිමානයක් ගෙන ඒමෙන් ඔබ්බට, ක්‍රීඩාව විනය, ශක්තිමත් චරිත සහ යහපත් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් නිර්මාණය කිරීමට දිරිය ලබාදේ. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්", යන දැක්ම සහිත ශ්‍රී ලංකාවේ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ජවසම්පන්න පුරවැසියෙකු - ජයග්‍රාහී ජනතාවක් නිර්මාණය කිරීම අරමුණු කරයි. ක්‍රීඩා අංශයේ මූලික අරමුණ වන්නේ දක්ෂ, සෞඛ්‍ය සම්පන්න සහ විනයගරුක පුද්ගලයන් පෝෂණය කරන ක්‍රීඩා සංස්කෘතියක් වර්ධනය කිරීමයි. කුඩා කල සිටම ක්‍රීඩා කිරීමට දරුවන් දිරිමත් කිරීම, ජාත්‍යන්තර තලයට තරඟ කිරීමට සුවිශේෂී දක්ෂතා ඇති අය හඳුනාගෙන පුහුණු කිරීම, ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ක්‍රීඩා උපදේශකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සම්පත් ලබා දීම මෙයට ඇතුළත් වේ.

ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම සහ ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා සහය දැක්වීම සඳහා ක්‍රීඩා අංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. ඒ අනුව ක්‍රීඩා අංශය විසින් ව්‍යාපෘති යෝජනා 12ක් ඇගයීමට ලක් කර අවශ්‍ය නිර්දේශ 2025 වසරේ ඉදිරිපත් කරන ලදී. තවද, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 07ක් සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

2.2 කෘෂිකර්ම

කෘෂිකාර්මික අංශය

2024 දී දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්ම අංශයේ දායකත්වය 7.5% ක් ලෙස වාර්තා වන අතර, ආර්ථිකයේ අනෙකුත් අංශ සමඟ ඒකාබද්ධ වීම තුළින් රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට මෙන්ම ජාතික හා ගෘහස්ථ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවයට ද මෙම අංශය දායක වේ. තවද රටේ ශ්‍රම බලකායෙන් 25% ක් පමණ කෘෂිකාර්මික අංශය හා සම්බන්ධ වේ. රටේ මුළු භූමි ප්‍රමාණයෙන් 30% ක් පමණ මෙම අංශය විසින් උපයෝජනය කරනු ලබන අතර, ඉන් සැලකිය යුතු ප්‍රතිශතයක් (40% ක් පමණ) වී වගාව සඳහා යෙදවේ.

කෘෂිකාර්මික අංශය මගින් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය, ජීවනෝපාය සහ රැකියා උත්පාදනය සහ අපනයන ආදායම් ඉපයීම තුළින් ආර්ථිකය සඳහා දක්වන දායකත්වය හේතුවෙන් එය ආර්ථිකයෙහි ප්‍රමුඛ අංශයක් ලෙස සැලකේ. ස්වාභාවික සම්පත්, විශේෂයෙන් භූමිය තීරණාත්මක සාධකයක් වීම හේතුවෙන් නිෂ්පාදනය ව්‍යාප්ත වීමට එය මූලිකවම බාධාවක් වී ඇත. ඒ අනුව තාක්ෂණික මැදිහත් වීම් තුළින් එම අංශයේ ඵලදායිතාව වැඩි කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම මෙන්ම එම අංශයේ කැපී පෙනෙන වර්ධනයක් පවත්වා ගැනීමට හැකි වනු ඇත. කෙසේ වුවද දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම මෙම අංශයට ප්‍රධාන අභියෝගයක් වී ඇති අතර එය මෑතකදී ඇති වූ දිත්වා සුළි කුණාටුවෙන් තවදුරටත් ගම්‍ය විය.

ආහාර බෝග කෘෂිකර්මය

ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීමේදී ආහාර බෝග කෘෂිකර්ම අංශයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, එම අංශයේ ඵලදායිතාව වැඩි කිරීම සහ වෙළඳපල ගතිකත්වය විධිමත් කිරීමට රජයේ ප්‍රතිසංස්කරණ මගින් නිසි අවධානය යොමු කරන ලදී.

මෙම ප්‍රතිසංස්කරණ මගින් සාම්ප්‍රදායික කෘෂිකර්මය නවීන, ඔරොත්තු දෙන සහ තිරසාර අංශයක් බවට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව, ආහාර නිෂ්පාදනය සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ගොවීන්ට/නිෂ්පාදකයින්ට සහනදායී අනුපාතයකින් මූල්‍ය දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.

වෙළඳපොල පහසුකම් සැපයීම ද සිදුකරනු ලබන අතර තරගකාරීත්වය රඳවා ගැනීමට සහ අගය දාම ශක්තිමත් කිරීමට ව්‍යවසායකයින් සඳහා ණය සහ ප්‍රදාන පහසුකම් ලබා දීම ද සිදු කරනු ලැබේ.

තවද 2025 අග භාගයේදී, දිත්වා සුළි කුණාටුවෙන් ආහාර බෝග අංශයට සිදු වූ දැඩි හානිය නොතකා, එම අංශයේ වර්ධන වේගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය "වඩා හොඳින් නැවත ගොඩනැගීමේ" අවශ්‍යය පියවර ගනිමින් සිටියි.

නිම කරන ලද කාර්යයන්

- සංවර්ධන ව්‍යාපෘති යෝජනා 15 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 06 ක් සඳහා නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් ඉදිරිපත් කරන ලදී.

විශේෂ කාර්යයන්:

- අදාළ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ ඉඩම් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය සංවාදයක් සංවිධානය කිරීමේ දී ලෝක බැංකුවට සහාය වන ලදී.
- "ආහාර බෝග කෘෂිකර්ම අංශය" සඳහා අදාළ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ආපදා දත්ත එකතු කිරීමේ පද්ධතියට (Disaster Data Collection System (DDCS)) ආපදා හානි දත්ත ඇතුළත් කරන ලදී.
- ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ව්‍යාපෘති සකස් කිරීමේදී අදාළ අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබා දෙන ලදී.
- දැනට ක්‍රියාත්මක සහ නව ව්‍යාපෘති ඇතුළත්කර "ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති" පිළිබඳ වාර්තාව සම්පාදනය කරන ලදී.
- නව සහ දැනට ක්‍රියාත්මක රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ඇතුළත්කර මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) යාවත්කාලීන කරන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ Aide Memoire සඳහා නිරීක්ෂණ සපයන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල ජාතික මෙහෙයුම් කමිටුවලට සහභාගී වන ලදී.

පශු සම්පත් අංශය

පශු සම්පත් අංශය ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවයට සැලකිය යුතු දායකත්වයක් සපයන අතර, ආසන්න වශයෙන් මිලියන 1.6 ක ජනතාවකට ජීවනෝපාය සලසා දෙයි. මෙම අංශය දළ දේශීය නිෂ්පාදිතයට 1% කටත් වඩා අඩු දායකත්වයක් ලබා දුන්නද, එමගින් උත්පාදනය වන ග්‍රාමීය රැකියා, දරිද්‍රතාවය පිටුදැකීමට සහ සමස්ත ආර්ථික සංවර්ධනය සඳහා උපකාරී වේ. මෙම අංශයට ගවයන්, මී හරකුන්, එළුවන්, කුකුළන් සහ ඌරන් ඇතුළත් වේ.

පශු සම්පත් සංවර්ධනයේ ප්‍රධාන උප අංශය කිරි කර්මාන්තයයි. දේශීය කිරි නිෂ්පාදනය දැනට දේශීය අවශ්‍යතාවයෙන් 50% ක් පමණ සපුරාලයි. ඉතිරි අවශ්‍යතාවය ආනයනික කිරිපිටි මගින් පියවනු ලබන අතර, ඒ සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 50 ක් පමණ වැය වේ. කුකුළු නිෂ්පාදන අංශය මුළුමනින්ම පාහේ පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන අතර, එය සිදුකරනු ලබන්නේ යෙදවුම් සැපයුම සහ අලෙවිකරණය සඳහා කුඩා පරිමාණ ගොවීන් සමඟ ඇතිකරගනු ලබන ගිවිසුම් හරහා ය. කුකුළු නිෂ්පාදන අංශය සඳහා රජයේ මැදිහත්වීම බොහෝ දුරට සෞඛ්‍ය කළමනාකරණය, පර්යේෂණ සහ සංවර්ධන සහ තත්ත්ව සහතික කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් යොමු කර ඇත. මෙම අංශයට දේශීය අවශ්‍යතාවය සපුරාලීමේ හැකියාව ඇති අතර, සත්ව ප්‍රෝටීන් සැපයීමේ ප්‍රධාන ප්‍රභවයක් ලෙස ද කටයුතු කරයි.

රජයේ ප්‍රතිපත්තිමය අරමුණ වන්නේ පශු සම්පත් අංශය, කෘෂිකාර්මික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීමයි. ඒ අනුව රජයේ ප්‍රතිසංස්කරණ ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය ඉහළ නැංවීම, රෝග නිවාරණය හා වැළැක්වීම සහ අගය දාමය වැඩිදියුණු කිරීම සඳහා යොමු කර ඇති අතර, එමගින් ගෘහස්ථ ජීවනෝපාය, අපනයන විභවයන් ඉහළ නැංවීම සහ පාරිසරික තිරසාරභාවය සහතික කිරීම අපේක්ෂා කෙරේ.

නිම කරන ලද කාර්යයන්

- සංවර්ධන ව්‍යාපෘති යෝජනා 08ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 01ක් සඳහා නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් ඉදිරිපත් කරන ලදී.

විශේෂ කාර්යයන්

- "පශු සම්පත් අංශය" සඳහා අදාළ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන්, ආපදා දත්ත එකතු කිරීමේ පද්ධතියට (Disaster Data Collection System- (DDCS)) ආපදා හානි දත්ත ඇතුළත් කරන ලදී.
- ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ව්‍යාපෘති සකස් කිරීමේදී අදාළ අමාත්‍යාංශවලට අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබා දෙන ලදී.
- දැනට ක්‍රියාත්මක සහ නව ව්‍යාපෘති ඇතුළත්කර "ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති" පිළිබඳ වාර්තාව සම්පාදනය කරන ලදී.
- නව සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති ඇතුළුව මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) යාවත්කාලීන කරන ලදී.

ඉඩම් හා වාරිමාර්ග අංශය

වාරිමාර්ග

ජල බෙදා හැරීම සාධාරණ ලෙස සහතික කිරීම, නව ජල සම්පත් සංවර්ධනය කිරීම සහ ගංවතුර පාලනය කිරීම මගින් ජාතික ආහාර සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම සඳහා වාරිමාර්ග අංශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. වර්තමානයේ, ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම 517 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ පළාත් සභා විසින් කළමනාකරණය කරනු ලබන අතර, සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 29,369 ක් පමණ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

කෙසේ වෙතත්, දේශගුණික විපර්යාස, හේතුවෙන් සිදුවන ස්වභාවික ව්‍යසන , කාලයත් සමග අගය ක්ෂය වන යටිතල පහසුකම්, ජලාශ වල පස් පුළුල් ලෙස අවසාදිත වීම, ජලජ වල් පැලෑටි ව්‍යාප්තිය සහ ඇළ මාර්ග සහ ගංවතුර තැනිතලා ආක්‍රමණය කිරීම වැනි අභියෝග කිහිපයකට මෙම අංශය මුහුණ දෙයි. මෙම ගැටළු විසඳීමට , කෘෂිකර්මාන්තය සහ අනෙකුත් තීරණාත්මක අවශ්‍යතා සඳහා ජල ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමුඛ පෙළේ මුලපිරීම් කිහිපයක් දියත් කර ඇත. මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන, මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සහ දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන මෙයට ඇතුළත් වේ.

රටේ මූල්‍යමය සීමාවන් සහ සීමිත මානව සම්පත් වලට ප්‍රතිචාර වශයෙන්, සංවර්ධන ප්‍රමුඛතා පවත්වා ගනිමින් මූල්‍යමය වශයෙන් ශක්‍ය විකල්ප හඳුනා ගැනීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග නැවත තක්සේරු කර ඇත. කෘෂිකාර්මික ඵලදායිතාවයට සහ ආහාර සුරක්ෂිතතාවයට ඇති සෘජු දායකත්වය හේතුවෙන් ජලප්‍රවාහ පාදක ජල සම්පත් සංවර්ධනය ප්‍රධාන මැදිහත්වීමක් ලෙස හඳුනාගෙන ඇත. මීට අමතරව, ජල අවශ්‍යතාවය සපුරාලීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු

කිරීම සඳහා ඉලක්කගත වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ ජල ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ.

වසර අවසානයේ ඇති වූ දිත්වා සුළි කුණාටුව වාරිමාර්ග යටිතල පහසුකම්වලට දැඩි හානියක් සිදු කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, හානි සහ පාඩු තක්සේරු කිරීමට සහ බලපෑමට ලක් වූ වාරිමාර්ග පද්ධති නැවත ගොඩනැගීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීමට අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පුළුල් වැඩසටහනක් ආරම්භ කරන ලදී.

සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති යෝජනා 10ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- වාරිමාර්ග අංශයට අදාළ කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ 17ක් ඉදිරිපත් කරන ලදී.

විශේෂ කාර්යයන්

- වාරිමාර්ග අංශය සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් "ආපදා දත්ත එකතු කිරීමේ පද්ධතියට " ආපදා හානි දත්ත ඇතුළත් කිරීම.
- වියළි කලාපයේ කුඩා වතු හිමියන් අතර දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) සහ "වැව්ගම්පුබුදුව" වැඩසටහන වැනි ප්‍රධාන මුලපිරීම්වල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රගතිය සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා අඛණ්ඩව දායක වීම.
- බාහිරව අරමුදල් සපයන වැඩසටහන්වලට අදාළ Aide Memoire සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.
- ඵලදායී ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය අමාත්‍යාංශ වෙත නිතිපතා උපදෙස් ලබා දීම.

ඉඩම් සම්පත් කළමනාකරණය

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා ඌන උපයෝජිත සහ නිෂ්ක්‍රීය ඉඩම්වල ඵලදායී භාවිතය ජාතික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත. තරඟකාරිත්වය ශක්තිමත් කිරීම සහ ආදායම් උත්පාදනය පුළුල් කිරීම සඳහා ඉහළම වටිනාකමක් ඇති භාවිතය සඳහා ඉඩම් උපායමාර්ගිකව වෙන් කිරීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රධාන කොටස්කරුවන් සමඟ සහයෝගයෙන් අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය ප්‍රසාරණය කිරීම අරමුණු කරගත් "ඉඩම් බැංකුවක්" පිහිටුවීම, මධ්‍යම ප්‍රතිපත්තිමය මුලපිරීමක් වී ඇත. තවද, "බිම්සවිය" ඉඩම් හිමිකම් වැඩසටහන ඉඩම් අයිතිය පැහැදිලි කිරීම සඳහා සැලකිය යුතු ලෙස දායක වී ඇති අතර එමඟින් වැඩිදියුණු කළ ඉඩම් භාවිතය, පෞද්ගලික ආයෝජන සහ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සපයයි.

මෙම උත්සාහයන්ට සහාය වීම සඳහා, ප්‍රමුඛතා සංවර්ධන ව්‍යාපෘති වේගයෙන් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි පරිපාලන හා නීතිමය ප්‍රතිසංස්කරණ හරහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් විධිමත් කර ඇත.

සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති යෝජනා 01ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- ඉඩම් අංශයට අදාළ කැබිනට් සංදේශ කිසිවක් ලැබී නැත.

විශේෂ කාර්යයන්

- ක්‍රියාත්මක වන ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රගතිය සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා දායක වීම.
- බාහිරව අරමුදල් සපයන වැඩසටහන්වලට අදාළ Aide Memoire වලට නිරීක්ෂණ ලබා දෙන ලදී.
- ඵලදායී ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය අමාත්‍යාංශවලට නිතිපතා උපදෙස් ලබා දීම සිදුකරන ලදී.

වැවිලි

වැවිලි අංශය මෙරට අධික ශ්‍රම දායකත්වයක් සහිත ක්ෂේත්‍රයක් වන අතර, එය රටෙහි සමාජ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබයි. තේ, රබර් සහ පොල් ප්‍රධාන වැවිලි බෝගයන් වන අතර, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත්, උක්, බඩ ඉරිඟු සහ කහ මෙම අංශයට අයත් අනෙකුත් සුළු අපනයන බෝගයන් වේ. වර්තමානයේදී, දළ දේශීය නිෂ්පාදිතයට මෙම අංශයේ දායකත්වය 2% ක් පමණ වන අතර, රටෙහි සමස්ත අපනයන අදායමට දක්වන දායකත්වය 22% ක් පමණ වේ. වැවිලි අංශය ආශ්‍රිතව මිලියන 1.5 ක පමණ පිරිසකට ජීවනෝපාය අවස්ථා නිර්මාණය වී ඇත. 2025 වසරේදී වැවිලි අංශයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඵලදායීතාව වැඩිදියුණු කිරීම, පර්යේෂණ හා සංවර්ධන ඉහළ නැංවීම, අගය දාම සංවර්ධනය සහ ඒ හරහා අපනයන ඉහළ නැංවීම සඳහා කටයුතු කර ඇත.

නිම කරන ලද කාර්යයන්

- වැවිලි අංශයට අදාළව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 45 ක් ඇගයීමට ලක් කර යෝජනා 28 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 15 ක් සඳහා නිරීක්ෂණ / අදහස් ඉදිරිපත් කරන ලදී.

විශේෂ කාර්යයන්

- ශ්‍රී ලංකාවේ වැවිලි අංශය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ඉඩම් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහ තිරසර කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයට සහභාගී වීම.
- Knowledge Sharing Programme (KSP) අදාළව නව ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා උපායමාර්ගික සැලැස්මක් සහ මාර්ග සිතියමක් සකස් කිරීම සම්බන්ධයෙන් වන මෙහෙයුම් කමිටුවට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවේ රබර් අංශය සඳහා මාර්ග සිතියම සකස් කිරීමේ වැඩමුළුවට සහභාගී වීම.
- යෝජිත කෘෂිකාර්මික අගය දාම මූලාකරණ සහ වාණිජකරණ අංශ සංවර්ධන වැඩසටහනේ (ADB) වැවිලි අංශයට අදාළ ප්‍රතිපත්ති පාදක ණය සංරචක ක්‍රියාකාරකම් ඉටු කිරීම සම්බන්ධීකරණය කිරීම.

ධීවර

ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනයට උපයෝගී කර ගත හැකි අති විශාල ධීවර හා ජලජ සම්පත් හා ඒ ආශ්‍රිත අවස්ථාවන් ශ්‍රී ලංකාව සතුව පවතී. ධීවර අංශය රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය 1% ක් පමණ වන අතර, වර්තමානයේදී වාර්ෂික මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන අපනයන ආදායම ඇ. ඩො. මිලියන 300 ක් පමණ වේ. දැනට ධීවර පවුල් මිලියනයකට වඩා සිටින අතර, මෙම අංශය පුද්ගලයින් 586,000 කට පමණ සෘජු හා වක්‍ර රැකියා සපයනු ලබයි. විදේශ විනිමය ඉපැයීම්, රැකියා උත්පාදනය සහ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම හරහා ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට මෙම අංශයට ඉහළ විභවතාවයක් ඇත. ඒ අනුව, ධීවර යටිතල පහසුකම් සංවර්ධනය, මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම, කරදිය හා ජලජීවී වගා නිෂ්පාදනය වැඩි කිරීම, පර්යේෂණ හා සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා රාජ්‍ය ආයෝජන සිදු කර ඇත.

නිම කරන ලද කාර්යයන්

- අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 39 ක් ඇගයීමට ලක් කර ව්‍යාපෘති යෝජනා 19 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් සඳහා නිරීක්ෂණ / අදහස් ඉදිරිපත් කරන ලදී.

විශේෂ කාර්යයන්

- ධීවර හා ජලජීවී වගාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සමාලෝචනය කිරීම.
- යුරෝපා සංගමයේ ප්‍රතිපාදන සලකා බැලීම සඳහා පැවති වරාය සහ ධීවර සංවර්ධන යෝජනා පිළිබඳ මූලික සාකච්ඡාවට සහභාගී වීම.
- යෝජිත කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණ සහ වාණිජකරණ අංශ සංවර්ධන වැඩසටහනේ (ADB) ධීවර අංශයට අදාළ ප්‍රතිපත්ති පාදක ණය සංරචක ක්‍රියාකාරකම් ඉටු කිරීම සම්බන්ධීකරණය කිරීම.

2.3 කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක

කර්මාන්ත අංශය

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය 2025 වර්ෂයේදී ද දළ දේශීය නිෂ්පාදිතයට 28% ක පමණ දායකත්වයක් ලබා දෙමින් ජාතික සංවර්ධනයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි. එය නිෂ්පාදනය, ඉදිකිරීම්, පතල් කැණීම් සහ උපයෝගීතා යන උප අංශයන්ගෙන් සමන්විත වන අතර ඇඟලුම් සහ රෙදිපිළි විශාලතම අපනයන ආදායම උපයන අංශය ලෙස ක්‍රියා කරයි. අනෙකුත් ප්‍රධාන කර්මාන්ත අතරට රබර් ආශ්‍රිත නිෂ්පාදන, පිඟන් භාණ්ඩ, නැව් නිෂ්පාදනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා සහ ආහාර සැකසුම් ඇතුළත් වේ. මෑතකාලීන ආර්ථික අර්බුද අභියෝග මධ්‍යයේ වුවද, රැකියා සහ විදේශ විනිමය ඉපැයීම් සඳහා මෙම අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කාර්මික නවීකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ අපනයන විවිධාංගීකරණය ප්‍රධාන වශයෙන් කර්මාන්ත අංශය තිරසාර වර්ධනය සඳහා කේන්ද්‍රීය වේ. නවෝත්පාදනය, තිරසාරභාවය සහ ගෝලීය තරඟකාරීත්වය පිළිබඳ උපායමාර්ගික අවධානය තුළින් ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාවේ කාර්මික පදනම ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඒ අනුව, රට තුළ කර්මාන්ත අංශය නඟා සිටුවීමේ අරමුණින් 2025 වර්ෂය තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 42 ක් ඇගයීමට ලක් කර අදාළ පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

- කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 08ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ යාවත්කාලීන දත්ත ගබඩාවක් (Data Repository) පවත්වාගෙන යාම.
- කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු /නියෝජිත ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද, දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම සහ ඒ අනුව මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) යාවත්කාලීන කිරීම.
- රටේ සංවර්ධන රාමුවට අනුකූලව සුදුසු ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතන සඳහා අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- ජාතික ඛනිජ ප්‍රතිපත්තිය සැකසීමට අදාළ රැස්වීම්වලදී අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචනය සහ විදේශ දූත මණ්ඩල ඇතුළු රැස්වීම්වලට සක්‍රීයව සහභාගී වීම.

වෙළඳ අංශය

ශ්‍රී ලංකාවේ වෙළඳ අංශය ගෝලීය ඒකාබද්ධතාවයේ අවස්ථා සහ අභියෝග යන දෙඅංශයම පිළිබිඹු කරමින් ආර්ථික සංවර්ධනයේ මූලික අංගයක් ලෙස ක්‍රියා කරයි. ඇඟලුම්, තේ, රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා මගින් මෙහෙයවනු ලබන අපනයන විදේශ විනිමය ඉපැයීම් සඳහා අත්‍යවශ්‍ය වන අතර ඉන්ධන, යන්ත්‍රෝපකරණ සහ අතරමැදි භාණ්ඩ ආනයනය ව්‍යුහාත්මක යැපීමට ප්‍රධාන වශයෙන් හේතුවේ.

අපනයන විවිධාංගීකරණය ශක්තිමත් කිරීම, වෙළඳ පහසුකම් වැඩිදියුණු කිරීම සහ ගෝලීය වටිනාකම් දාමයන් සමඟ පෙළගැස්වීම තරඟකාරිත්වය ඉදිරියට ගෙන යාම සඳහා මෙන්ම තිරසාර සහ නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් ගේ අන්තර්ගත ජාතික සංවර්ධනයක් සඳහා වෙළඳ අංශය දක්වන දායකත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් සාධක වේ. ඒ අනුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය තුළ නිම කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 02 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ යාවත්කාලීන දත්ත ගබඩාවක් (Data Repository) පවත්වාගෙන යාම.
- වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද නව සහ අඛණ්ඩ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම සහ මධ්‍යම කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- පාර්ශවකරුවන්ගේ උපදේශන රැස්වීම් සහ තාක්ෂණික රැස්වීම් වලට සහභාගී වීමෙන් ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ කෙටුම්පත් කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීම.
- ලෝක වෙළඳ සංවිධානයේ 5 වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා පුළුල් ලෙස දායක වීම.

ආයෝජන ප්‍රවර්ධනය

මෑතකාලීන ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම් මධ්‍යයේ, ශ්‍රී ලංකාව සැලකිය යුතු ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා අභියෝගාත්මක මාවතක ගමන් කරයි. රජයේ ප්‍රමුඛතාවය වන්නේ තිරසාර දේශීය හා විදේශීය ආයෝජන හරහා නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම සහ අපනයන ප්‍රවර්ධනය කිරීමයි. ආයෝජන ප්‍රවර්ධනය කෘෂිකර්මය, කර්මාන්ත සහ සේවා නවීකරණය කිරීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස සලකනු ලබන අතර, එයට සමගාමීව මෙරට ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහාද දායක වේ. ගෝලීය ප්‍රතිසාධන අත්දැකීම් තුළින් ස්ථාවරත්වය සහ දිගුකාලීන පරිවර්තනය සහතික කිරීම සඳහා දේශීය ආයෝජන ශක්තිමත් කරන අතරම, තාක්ෂණ හුවමාරුව සහ තරඟකාරීත්වය සඳහා ඍජු විදේශ ආයෝජන ලබා ගැනීම ඉතා වැදගත්වේ. ඉහත ප්‍රතිඵල ඉලක්ක කොටගෙන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 2025 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- ව්‍යාපෘති යෝජනා 08 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කර යාවත්කාලීන දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- ආයෝජන ප්‍රවර්ධන අංශයට අදාළ නව සහ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දත්ත රැස් කර, ඒ අනුව මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- රටේ සංවර්ධන රාමුවට අනුකූලවන පරිදි ව්‍යාපෘති ගොඩනැගීම සඳහා රේඛීය අමාත්‍යාංශ ඇතුළු අදාළ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන සහ විදේශ දූත මණ්ඩල රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

සංචාරක අංශය

සත්කාරක රටවලට ආර්ථික, සමාජ-සංස්කෘතික සහ පාරිසරික ප්‍රතිලාභ ගෙන එන සංචාරක කර්මාන්තය ගෝලීය වශයෙන් ප්‍රමුඛ පෙළේ කර්මාන්තවලින් එකකි. සංචාරක කර්මාන්තයේ ප්‍රධාන සම්පත් ස්වභාවික, සංස්කෘතික, මානව සහ ප්‍රාග්ධනය යන ප්‍රධාන ක්ෂේත්‍ර හතරකින් හඳුනාගත හැකිය. මෙම සම්පත් ඵලදායි ලෙස ඒකාබද්ධ කිරීමෙන් මනාව සැලසුම් කළ සංචාරක කර්මාන්තයක් දියුණු කළ හැකිය. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් "යන දැක්ම සහිත ශ්‍රී ලංකාවේ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ සංචාරක ව්‍යාපාරය එහි ආර්ථිකයේ විදේශ විනිමය උපයන නවීකරණය කරන ලද සංචාරක කර්මාන්තයක් - ආකර්ශනීය අවසාන ගමනාන්තයක් ලෙස දියුණු කළ හැකි වැදගත් අංශයක් ලෙස හඳුනාගෙන ඇත. සංචාරක ව්‍යාපාරය ස්වභාවික පරිසරය හා සොබා සෞන්දර්ය මත පදනම් වූ සහ දේශීය සංස්කෘතියට හිතකර කර්මාන්තයක් ලෙස පුළුල් ජනතා සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව, 2025 වසරේ විදේශ සංචාරකයින්ගේ පැමිණීමේ පැහැදිලි වර්ධනයක් ඇති කරමින් විදේශ සංචාරකයින් අතර, ශ්‍රී ලංකාව දකුණු අසියානු කලාපය තුළ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් අවශ්‍ය පියවර ගනිමින් සිටී.

සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම හා ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව සංචාරක අංශය 2025 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදී.

- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ලබාදෙන ලදී.
- ව්‍යාපෘති යෝජනා 18 ක් ඇගයීම් කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- සංචාරක අංශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ/ලෝක බැංකුවේ මෙහෙවර (Mission) සඳහා ආරම්භක රැස්වීම් සංවිධානය කිරීම.

2.4 වානිජ යටිතල පහසුකම්

ප්‍රවාහන, මාර්ග, වරාය හා ගුවන් සේවා

ප්‍රවාහන අංශය ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනයේ මූලිකයෙකු ලෙස ක්‍රියා කරනු ලබන අතර අධ්‍යාපන, වෙළඳාම, සංචාරක ව්‍යාපාරය සහ අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සළසයි. මගී සහ භාණ්ඩ ප්‍රවාහනයෙන් 90% කට ආසන්න ප්‍රමාණයක් මාර්ග පද්ධතිය මගින් සිදු කරනු ලබන අතර, එය දේශීය සම්බන්ධතාවය හා ආර්ථික ක්‍රියාකාරකම් සඳහා එමගින් ඇති කරන අත්‍යවශ්‍ය භූමිකාව අවධාරණය කරයි. සමුද්‍රීය අංශයේ, ජාත්‍යන්තර වෙළඳාමෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් මුහුදු ප්‍රවාහනය හරහා සිදු කරනු ලබන අතර, කොළඹ වරාය කලාපයේ ප්‍රමුඛ ප්‍රතිනැව්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ. ගුවන් සේවා අංශය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ වැනි ප්‍රධාන ද්වාරයන් හරහා මගී සහ භාණ්ඩ ප්‍රවාහනයට අඛණ්ඩව සහාය වේ.

ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වයන් සහ පවතින සීමිත මූල්‍ය අවකාශය සැලකිල්ලට ගැනීමේදී, විශේෂයෙන් ප්‍රවාහන අංශයේ, ප්‍රාග්ධන-අධික (capital-intensive) වන සහ සාමාන්‍යයෙන් මහා පරිමාණ, දිගුකාලීන කැපවීම් (long term commitments) ඇතුළත් වන යටිතල පහසුකම් ආයෝජන සඳහා සම්පත් වගකීමෙන් වෙන් කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, සීමිත රාජ්‍ය අරමුදල් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ අනුකූලවීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති සාර්ථකව පරීක්ෂා කර, ප්‍රමුඛතාගත කර, ඇගයීම් කරන ලදී.

පොදු ප්‍රවාහනය නවීකරණයට සහාය දක්වන, රථවාහන තදබදය අවම කරනු ලබන සහ මාර්ග ආරක්ෂාව සඳහා වන ප්‍රතිඵලයන් (outcomes) වැඩිදියුණු කරනු ලබන මුලපිරීම් කෙරෙහි අවධාරණය යොමු කරන ලදී. එමෙන්ම, ජාතික සම්බන්ධතාවය සහ ආර්ථික තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා වරාය සහ ගුවන්තොටුපළවල මෙහෙයුම් ධාරිතාව සහ යටිතල පහසුකම් සංවර්ධනය ශක්තිමත් කරන අතරම, විදුලි සංචලනය ක්‍රමයෙන් භාවිතා කිරීම ඇතුළුව පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවාහන විසඳුම් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

නිම කරන ලද කාර්යයන්

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති හා වැඩසටහන් (95) ඇගයීම.
- ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය හෝ මෙම අංශවලට අදාළව ඕනෑම අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශ හා ප්‍රතිපත්ති පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ (48) සකස් කිරීම.
- ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමේදී අදාළ රේඛීය අමාත්‍යාංශවලට තාක්ෂණික යෙදවුම් ලබා දීම.

- ශ්‍රී ලංකා ජාතික නාවික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය හා ශ්‍රී ලංකා තිරසාර ගුවන් සේවා පාරිසරික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- පහත සඳහන් කමිටුවල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
  - යටිතල පහසුකම් සහ උපායමාර්ගික සංවර්ධනය පිළිබඳ කමිටුව
  - ව්‍යාපෘති මෙහෙයුම් කමිටු
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සහ දෙපාර්තමේන්තුව විසින් වරින් වර සකස් කරනු ලබන අනෙකුත් වාර්තා සඳහා අවශ්‍ය දත්ත හා තාක්ෂණික තොරතුරු ලබා දීම.
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා නිරීක්ෂණ ලබා දීම.

විදුලි හා බලශක්ති අංශය

බලශක්ති අංශය නූතන කාර්මික ආර්ථිකයන්හි මූලික පදනමක් ලෙස ක්‍රියා කරමින්, සමාජීය හා තාක්ෂණික සංවර්ධනයට සහාය වෙමින් ආර්ථික වර්ධනය මෙහෙයවයි. පසුගිය වසර කිහිපය තුළ ගෝලීය බලශක්ති ක්ෂේත්‍රය සැලකිය යුතු පරිවර්තනයකට ලක්ව ඇති අතර, පුනර්ජනනීය බලශක්තියේ වේගවත් ව්‍යාප්තිය, විදුලි වාහන භාවිතයේ වර්ධනය සහ කාබන් විමෝචනය අඩු කර පිරිසිදු බලශක්තියේ කොටස ඉහළ නැංවීම අරමුණු කරගත් බලශක්ති සංක්‍රාන්ති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් එය පැහැදිලි වේ. බලශක්ති ගබඩා කිරීමේ තාක්ෂණයන්හි සහ බලශක්ති කාර්යක්ෂමතාවයේ දියුණුව, සමස්ත බලශක්ති පරිභෝජනය අඩු කිරීමට දායක වන අතරම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ඒකාබද්ධකර ගැනීම තවදුරටත් සක්‍රීය කර ඇත. භූ දේශපාලනික අවිනිශ්චිතතා, ඉන්ධන මිල අස්ථාවරත්වය සහ යටිතල පහසුකම් සීමාවන් වැනි අඛණ්ඩ අභියෝග මධ්‍යයේ වුවද, මෙම අංශය සැලකිය යුතු නවෝත්පාදන සහ තිරසාර වර්ධන අවස්ථා අත්පත්කර ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ බලශක්ති සහ විදුලිබල අංශ පිරිසිදු හා විවිධාංගීකෘත බලශක්ති මිශ්‍රණයක් වෙත ක්‍රමයෙන් පරිවර්තනය වෙමින් පවතින අතර, පුනර්ජනනීය විදුලිබල නිෂ්පාදනය, ජාල නවීකරණය, පද්ධති විශ්වසනීයතාවය සහ ඉල්ලුම්-පාර්ශව කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. සූර්ය හා සුළං බලශක්තිය විස්තාරණය කිරීම, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ වියදම්-ප්‍රතිබිම්බිත ගාස්තු සංශෝධන ප්‍රවර්ධනය කිරීම මඟින් ආනයනික ඉන්ධන මත යැපීම අවම කිරීම සඳහා උත්සාහයන් ක්‍රියාත්මක වේ. මෙයට සමගාමීව, දිගුකාලීන බලශක්ති සුරක්ෂිතතාවය, බලශක්ති ප්‍රභව වෙත ළඟා වීමේ පහසුව සහ තිරසාරභාවය තහවුරු කරමින් කර්මාන්ත, සේවා සහ ගෘහස්ථ අංශවල වැඩිවෙමින් පවතින විදුලිබල ඉල්ලුම සපුරාලීම සඳහා ස්වභාවික වායු, හරිත හයිඩ්‍රජන් සහ න්‍යෂ්ටික බලශක්තිය ඇතුළු විකල්ප බලශක්ති මාර්ග ගවේෂණය සිදු කරමින් පවතී.

- ව්‍යාපෘති යෝජනා 23 ක් ඇගයීමට ලක් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ/ නිර්දේශ ලබා දීම
- බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සඳහා නිරීක්ෂණ ලබා දී දී ඇති අතර, අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීමට අවශ්‍ය අදහස් ලබා දීම
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම
- දිත්වා සුළි කුණාටුවට අදාළව "පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගයීම් වාර්තාව" සකස් කිරීම පහසු කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අංශය කෙරෙහි ඇතිවූ හානිය පිළිබඳ දත්ත මාර්ගගත පද්ධතියක් හරහා එකතු කිරීම

ජල සැපයුම් හා සනීපාරක්ෂක අංශය

ජාතික ප්‍රතිපත්ති හා සංවර්ධන ප්‍රමුඛතාවන්ට අනුකූලව, ජල සැපයුම් හා සනීපාරක්ෂක අංශය විසින් රටේ ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කර ඇත. ජල සැපයුම් පද්ධතිවල ක්‍රියාත්මක ධාරිතාව තිරසර මට්ටමට වැඩි කිරීම සහ දැනට පවතින සමස්ත ජල නිෂ්පාදනයෙන් ආසන්න වශයෙන් සියයට 25 ක් පමණ ලෙස පවතින ආදායම් නොලබන ජල ප්‍රතිශතය (Non-Revenue Water – NRW) ක්‍රමවත් ලෙස අඩු කිරීම තුළින් පවතින ජල සැපයුම් පද්ධතිවල කාර්ය සාධනය සහ තිරසාරභාවය ශක්තිමත් කිරීම සඳහා, සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ප්‍රමුඛතා ලබා දී හඳුනාගත් අවශ්‍යතා මත, විශේෂයෙන්ම සේවා ආවරණය අඩු සහ වේගයෙන් නාගරීකරණය වන ප්‍රදේශයන්හි, නව නළ ජල සම්බන්ධතා ලබාදීම සඳහා, ඉලක්කගත ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් සුරක්ෂිත පානීය ජල ප්‍රවේශය ව්‍යාප්ත කර ඇත. දැනට ආසන්න වශයෙන් සියයට 2 ක් පමණක් වන ජාතික මලාපවහන නල ආවරණය අවම මට්ටමක පවතින බව සැලකිල්ලට ගනිමින්, නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ගෘහස්ථ මලාපවහන නල සම්බන්ධතා වැඩි කිරීම සහ පවතින මලාපවහන නල පද්ධතිවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්කගත මලාපවහන නල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

තවද, දුරස්ථ හා පහසුවෙන් ළඟා විය නොහැකි ප්‍රදේශවල පදිංචි ජන කොටස් මුහුණ දෙන ජල හා සනීපාරක්ෂක ගැටලු විසඳීම සඳහා විශේෂ අවධානය යොමු කරමින් ප්‍රජා මූලික ජල සැපයුම් යෝජනා ක්‍රම, දේශගුණයට ඔරොත්තු දෙන විකල්ප ජල විසඳුම් සහ වැඩිදියුණු කළ ස්ථානික සනීපාරක්ෂක පහසුකම් ඉලක්කගත ව්‍යාපෘති හරහා ක්‍රියාත්මක කරමින්, සියලු ජනතාවට සාධාරණ සහ සමාන ලෙස ආරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂාව ලබාදීම අරමුණු කර ඇත.

ජල සැපයුම් හා සනීපාරක්ෂක අංශයේ ප්‍රධාන දායකත්වයන් ලෙස ප්‍රතිපත්ති සැකසීම සඳහා සහාය ලබාදීම, ව්‍යාපෘති ඇගයීම සිදු කිරීම සහ නිවාස, ඉදිකිරීම් හා ජල සැපයුම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන ගරු අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහන් කළ හැක. ඒ අනුව, තිරසාර ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් වැසි ජල රැස් කිරීමේ ප්‍රතිපත්තිය හා උපායමාර්ගය වැඩිදියුණු කිරීම සඳහා වූ මූලපිරීම් සක්‍රියව ඉදිරියට ගෙන යමින් පවතී. එසේම, විසල් කුරුණෑගල ජල සැපයුම් හා මලාපවහන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පසු-ඇගයීමක් (Post Evaluation) දැනට සිදු කරමින් පවතින අතර, එමඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, සමාජ-ආර්ථික බලපෑම් සහ සේවා සැපයීමේ ප්‍රතිලාභ හඳුනාගෙන අනාවරණය කිරීම අරමුණු කර ඇත.

නිම කරන ලද කාර්යයන්

- ජල සැපයුම් හා සනීපාරක්ෂක අංශයට අදාළ ව්‍යාපෘති යෝජනා 18 ක් ඇගයීමට ලක් කර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- නිවාස, ඉදිකිරීම් හා ජල සැපයුම් අමාත්‍යාංශය ඇතුළු අදාළ රේඛීය ආයතන විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 13 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වී අවශ්‍ය දායකත්වය සහ අදහස් ලබා දෙන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වී අවශ්‍ය දායකත්වය සහ අදහස් ලබා දෙන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් සකස් කරන ලද සහය සටහන් (Aide Memoires) සඳහා තාක්ෂණික හා ප්‍රතිපත්තිමය නිරීක්ෂණ ලබා දෙන ලදී.

නාගරික සහ නිවාස සංවර්ධනය

රටේ ආර්ථික වර්ධනය, සමාජ පරිවර්තනය සහ නවීකරණය ලඟා කර ගැනීම සඳහා නාගරික සංවර්ධනය අත්‍යාවශ්‍ය වේ. ප්‍රතිපත්ති සම්පාදනය, යටිතල පහසුකම් සංවර්ධනය සහ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම තුළින් ශ්‍රී ලංකා රජය නාගරික සංවර්ධනය අත්කර ගැනීමෙහිලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ජීවත්වීමට සුදුසු සහ ආර්ථික වශයෙන් සමෘද්ධිමත් මධ්‍යස්ථාන බවට නගර පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, මාර්ග, පොදු ප්‍රවාහන පද්ධති, ජල සැපයුම, සනීපාරක්ෂාව, නිවාස ව්‍යාපෘති, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, වැසි ජල කළමනාකරණය සහ නාගරික පාරිසරික වැඩිදියුණු කිරීම ආදී විවිධ කටයුතු රජය විසින් ක්‍රියාත්මක කරයි. නගර සන්නාමකරණ ව්‍යාපෘතිය හරහා හඳුනාගත් සමහර නගර නැවුම් භූ දර්ශන, නාගරික උද්‍යාන, සනීපාරක්ෂක පහසුකම් සහ අනෙකුත් වැඩිදියුණු කළ පොදු පහසුකම් සහිත නගර බවට සංවර්ධනය කෙරෙමින් පවතී. මෙම සංවර්ධන වැඩසටහන් තුළින් රටේ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, ආයෝජන අවස්ථා ආකර්ෂණය කර ගැනීම සහ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරයි.

ප්‍රමාණවත් සහ දැරිය හැකි මිලකට නිවාස සඳහා ප්‍රවේශය සෑම පුද්ගලයෙකුගේම මූලික අවශ්‍යතාවයක් ලෙස සලකනු ලබන අතර, සුවපහසු ජීවිතයක් ගත කිරීම සඳහා සුරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර ජනාවාස ස්ථාපිත කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධනය, විශේෂයෙන් අඩු ආදායම්ලාභී ග්‍රාමීය ජනතාව, නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල පදිංචිකරුවන්, වතු ප්‍රජාවන්, ගැටුම්වලින් පීඩාවට පත් පවුල්, පශ්චාත් ආපදාවෙන් පීඩාවට පත් පවුල් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ ප්‍රයත්නවල ප්‍රධාන අවධානයක් යොමු කර ඇත. රාජ්‍ය මූලපිරීම් වලට අමතරව, පෞද්ගලික අංශය විසින්, මධ්‍යම ආදායම්ලාභී පවුල් ඉලක්ක කරගත් නිවාස වැඩසටහන් නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සිදු කරනු ඇත. ඉන්දීය රජය සහ මහජන චීන සමූහාණ්ඩුව ශ්‍රී ලංකාවේ නිවාස ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා ආධාර සපයයි. රජයේ අරමුදල්වලට අමතරව, රටේ නාගරික නිවාස වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ද යොදා ගැනේ.

නිම කරන ලද කාර්යයන්

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සටහන් 13 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම
- සංවර්ධන ව්‍යාපෘති යෝජනා 53 ක් තක්සේරු කිරීම සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ ගැටළු සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ දැන්වීම
- ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘතිවල විෂය පථය, පිරිවැය සංශෝධනය සහ කාලය දීර්ඝ කිරීම වැනි වෙනස්කම් පිළිබඳ නිර්දේශ ලබා දීම
- 2026 - 2030 රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම සහ විෂය පථයට අදාළව රාජ්‍ය යෝජනා කමිටුව සමඟ සම්බන්ධීකරණය කිරීම
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ප්‍රගති සමාලෝචන රැස්වීම් / ව්‍යාපෘති සහ වැඩසටහන් පිළිබඳ විශේෂිත රැස්වීම් සඳහා සහභාගී වීම
- මෙම අංශයට විශේෂිත ජාතික සහ ආංශික ප්‍රතිපත්ති ලේඛන සකස් කිරීම
- නාගරික සංවර්ධන හා නිවාස ව්‍යාපෘතිවලට අදාළ වාර්තා සකස් කිරීම
- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ සහ එහි සංවර්ධන ව්‍යාපෘතිවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම
- ආංශික සැලසුම් සකස් කිරීම සහ සංවර්ධනය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම

2.5 පාලනය

2025 වර්ෂයේ දී පාලන අංශය විසින් මෙරට කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හා නීතිය ක්‍රියාත්මක වන සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම පිණිස රජයේ ජාතික ආර්ථික ප්‍රතිපත්තිය මඟින් ප්‍රකාශිත අරමුණු හා ක්‍රමෝපායන් හා පදනම්ව වැදගත් කාර්යභාරයක් ඉටු කොට ඇත.

තවද, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමේ දී මෙන්ම මධ්‍යකාලීන අයවැය රාමුව සකස් කිරීමේ දී තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම අරමුණු කොට ක්‍රියාත්මක වී ඇත. එසේම නව තාක්ෂණය සබැඳි මහජන මිත්‍රශීලී රාජ්‍ය සේවයක් ගොඩනැගීම, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සුරැකීම, මිත්‍රශීලි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, වංචාවෙන් හා දූෂණයෙන් තොර රටක් බිහි කිරීම, හා රාජ්‍ය සේවය තුළ වගවීම තහවුරු කිරීම අරමුණු කොට පහත සඳහන් රාජ්‍ය අමාත්‍යාංශ හා අනෙකුත් ව්‍යුහයන්ට අදාල ක්ෂේත්‍රයන් හි ක්‍රමසම්පාදන ක්‍රියාවලියට දායකවී ඇත.

- රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන
- මහජන ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව
- ජනමාධ්‍ය
- අධිකරණ
- විදේශ කටයුතු
- ආගමික, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන්
- ප්‍රාදේශීය සංවර්ධන
- විශේෂ වියදම් ඒකක

ඒ අනුව, කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය කළමනාකරණයක් උදෙසා 2025 වර්ෂයේදී,

- රජයේ අරමුදල හෝ විදේශ අරමුදල මඟින් මූල්‍යයන කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 147 ක් ඇගයීමට ලක් කිරීම.
- විවිධ අමාත්‍යාංශ යටතේ ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 58 ක් සඳහා නිරීක්ෂණ හා විචාර ලබා දීම.
- අංශයේ විෂය පථය යටතේ මෙහෙයුම් කමිටු ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීම සහ සහභාගී වීම.
- ආර්ථික සංවර්ධනය සඳහා සන්නායක පරිසරයක් පෝෂණය කිරීම සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සහතික කිරීම සඳහා පාලන අංශය යටතේ ඇති රාජ්‍ය ආයතන මෙහෙයවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පත් කරන ලද කමිටුවක් ඇතුළුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටු හයක් (06) සහ ප්‍රතිපත්ති සම්පාදනය සහ සමාලෝචන කමිටු තුනක් (03) රැස්වීම්වල දී දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය නියෝජනය කිරීම.

සාර්ව ආර්ථික

සාර්ව ආර්ථික අංශය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශවලින් එකකි. ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව යටතේ සියලුම සංවර්ධන අංශ ඒකාබද්ධ කිරීමේදී එය කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරයි. දිගුකාලීන ජාතික සංවර්ධන අරමුණු සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා මෙම අංශය අනෙකුත් අංශවලට උපායමාර්ගික මග පෙන්වීමක් සපයයි.

ශ්‍රී ලංකා ආර්ථිකයේ නැගී එන අවස්ථා සහ විභව අවදානම් හඳුනා ගනිමින් දේශීය හා ගෝලීය ආර්ථික ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයන් මෙම අංශය විසින් සිදු කරයි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූලික කාලීන ප්‍රකාශන සකස් කිරීම ද ඒවා සම්බන්ධීකරණය කිරීම ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහ ලෝක බැංකුව (WB) ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ සම්බන්ධ වීමේ කේන්ද්‍රස්ථානය ලෙස ද ක්‍රියා කරනු ලබයි.

2025 දී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

2025 තුළ සාර්ව ආර්ථික අංශය විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- 'රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) 2026–2030' හි අදාළ පරිච්ඡේද සකස් කිරීමේදී ආංශික අංශ මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම.
- 'රාජ්‍ය ආයෝජන වැඩසටහන 2026–2030' සම්පාදනය කර මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීමට පහසුකම් සැලසීම.
- 'ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති 2025–2027' පිළිබඳ වාර්තාව සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ ගෝලීය ආර්ථිකයේ ප්‍රධාන අවස්ථා සහ අභියෝග හඳුනා ගනිමින් සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ පුළුල් විශ්ලේෂණ සිදු කිරීම.
- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව 'රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (PFM) රෙගුලාසි' සහ නියෝග සකස් කිරීම.
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (PFM) පනතේ විධිවිධානවලට අනුකූලව, 2026 වසර සඳහා නව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සලකා බලා අනුමත කිරීම සඳහා රාජ්‍ය ආයෝජන කමිටුවේ මංගල රැස්වීම මෙම වසරේදී කැඳවීම.
- ක්‍රියාත්මක වෙමින් පවතින සහ යෝජිත නව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා දත්ත ගබඩාවක් නඩත්තු කර යාවත්කාලීන කිරීම.
- IMF තාක්ෂණික සහාය මෙහෙයුම සමඟ සහයෝගයෙන් රාජ්‍ය ආයෝජන කළමනාකරණ තක්සේරුව (PIMA) සහ දේශගුණික PIMA වාර්තාව (2025 ජූලි) සම්පූර්ණ කිරීම.
- ලෝක බැංකුව සහ IMF ඇතුළු විදේශීය දූත මණ්ඩල කිහිපයක් සම්බන්ධීකරණය කිරීමට පහසුකම් සැලසීම.
- ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPD) නිලධාරීන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් කිහිපයක් පැවැත්වීම.

2.6 පරිසර කළමනාකරණය

මේ වනවිට ශ්‍රී ලංකාව පාරිසරික හායනය සහ දේශගුණික අභියෝග වැනි පාරිසරික අභියෝගවලට මුහුණ පා සිටී. එසේම ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස වලට බෙහෙවින් ලක්වන හෙයින් ආර්ථික සංවර්ධනයට ද සැලකිය යුතු ලෙස බලපාන දේශගුණික විපත්ති ද නිතර අත්විඳියි. දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් හේතුවෙන් ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වඩාත් අවධානමට ලක්විය හැකි රටක් ලෙස හඳුනා ගෙන ඇත. මෙම ව්‍යසනයන් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතියට බාධා පමුණුවනවා පමණක් නොව අවධානමට ලක්විය හැකි ප්‍රජාවට දුෂ්කරතා ඇති කිරීමටද හේතු වේ.

පාරිසරික කළමනාකරණයට ප්‍රමුඛත්වය ලබා දීම යනු හුදෙක් පරිසර සංරක්ෂණය පිළිබඳ සැලකිලිමත් වීම පමණක් නොව එය දිගුකාලීන තිරසර සංවර්ධනය, මානව යහපැවැත්ම හා ගෝලීය සහයෝගීතාව සඳහා උපායමාර්ගික ආයෝජනයක් සඳහාද මූලික වේ.

දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තනය වීම, වනජීවී හා වනාන්තර සංරක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය අවම කිරීම හා පරිසර පද්ධති සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් පාරිසරික කළමනාකරණය කෙරෙහි ශ්‍රී ලංකා රජය ඉහල ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. තවද, කෙටුම්පත් කරන ලද බැඳුම්කර රාමුව (Green Bond Framework), තිරසාර මූල්‍ය මාර්ග සිතියම (Sustainable Finance Roadmap) හා ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය (Green Finance Taxonomy) ඇතුළු නීල හරිත මූල්‍යකරණය සඳහා වන ශ්‍රී ලංකා රජයේ ප්‍රයත්නයන් තිරසර සංවර්ධනයට සහ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීමට ශ්‍රී ලංකාවේ කැපවීම පෙන්නුම් කරයි.

නිම කරන ලද කාර්යයන්

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 19 ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

විශේෂ කාර්යයන්

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) 2026–2030 සකස් කිරීම සඳහා දායක වීම.
- ජාතික ප්‍රතිපත්ති රාමුවේ (National Policy Framework) සාරාංශය සකස් කිරීම සඳහා දායක වීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාව සඳහා ඒකාබද්ධ දේශගුණික ආයෝජන සැලැස්ම (ICRIP) සකස් කිරීම සඳහා සහාය ලබා දීම .
- පරිසර සම්පත්වල අගය ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශය - (Green Book) සැකසීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ කටයුතු කිරීම .
- දිත්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ හානි පිළිබඳ දත්ත එක්රැස් කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද දත්ත පද්ධතිය (DDCS) සඳහා දත්ත සැපයීම සම්බන්ධීකරණය කිරීම
- සමුද්‍රීය අවකාශ සැලසුම්කරණය (Maritime Spatial Planning) වැඩසටහන සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම .
- පරිසර කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම .
- පරිසර අංශයට සම්බන්ධ විවිධ මෙහෙයුම් කමිටු සඳහා සහභාගී විම
- විදේශ දූත මණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම

ආපදා කළමනාකරණය

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් නිරිත දිග මෝසම් සමයේදී නිතර සිදුවන ගංවතුර හා නායයෑම්, අධික සුළං/චණ්ඩමාරුත, අකුණු සැර වැනි බහුවිධ ස්වාභාවික ආපදාවන්ගේ අහිතකර බලපෑම්වලට ලක්වේ. එක්සත් ජාතීන්ගේ ගෝලීය අවධානම් දර්ශකයට අනුව, 2022 වසරේදී ශ්‍රී ලංකාව ලෝකය පුරා රටවල් 185ක් අතරින් 104 වන ස්ථානය වාර්තා කර ඇත. තවද, 2021 දේශගුණික අවධානම් දර්ශකයට අනුව, ශ්‍රී ලංකාව රටවල් 180ක් අතරින් 30 වන ස්ථානයට පත්ව ඇත.

ස්වභාවික අපදා හේතුවෙන් පසුගිය වසර වල දී, මිනිස් ජනාවාස විනාශ කරමින් සහ දේපල හානි සිදුකරමින් සැලකිය යුතු මිනිස් මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇත. උදාහරණයක් ලෙස, 2025 නොවැම්බර් මස අගදී ශ්‍රී ලංකාවට බලපෑ දිත්වා සුළි කුණාටුව හේතුවෙන් රටේ දිස්ත්‍රික්ක 25 පුරාම විනාශකාරී ගංවතුර, නායයෑම් සහ සුළං හානි සිදුවිය. මෙම කුණාටුව මිලියන 2 කට අධික ජනතාවකට බලපෑ අතර, නිවාස, භෝග සහ යටිතල පහසුකම් වලට හානි වූ අතර, බොහෝ පවුල් අවතැන් වී නවාතැන් සහ ආධාර මත යැපෙන්නට සිදු විය. තවද ව්‍යසනය හේතුවෙන් සිය ගණනක් මරණ සහ පුළුල් දේපළ හානි සිදුවිය. ඊට අමතරව, 2015 - 2024 කාලය තුළ, ගංවතුර සහ නායයෑම් හේතුවෙන් මිනිස් මරණ 400 කට වැඩි සංඛ්‍යාවක් වාර්තා විය. එබැවින්, රටේ සංවර්ධන ගමන් මඟට අනුකූලව ආපදා අවධානම් අවම කිරීම සඳහා උපායමාර්ගික විසඳුම් ඇතුළත් කළ යුතු බව පසක් වේ.

තවද, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරමින් රටේ දිස්ත්‍රික්ක 13ක් නායයෑම් සහ ගංවතුර වලට ලක්විය හැකි තත්ත්වයක පවතී. (මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 30ක් සහ රටේ ජනගහනයෙන් සියයට 38ක් නියෝජනය කරමින්) මේ හේතුවෙන්, රට වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 40 සිට 75 දක්වා ආර්ථික පාඩුවකට මුහුණ දෙයි. තවද, රටේ පවතින ප්‍රතිපත්ති රාමුව සහ

සෙන්දායි රාමුව (Sendai Framework) වැනි ජාත්‍යන්තර වගකීම් වලට අනුකූලව, ආපදා අවධානම වටහා ගැනීම, ආපදා අවධානම් පාලනය ශක්තිමත් කිරීම තුළින් ස්වභාව ධර්මය හෝ මිනිසා විසින් ඇති කරන ලද හෝ පාරිසරික, තාක්‍ෂණික හා ජීව විද්‍යාත්මක ගැටලු හේතුවෙන් ඇති වන අවධානම් සෑම ආකාරයකින්ම අඩු කිරීමට අපේක්‍ෂා කරන අතර, ඒ හරහා ආපදා අවධානම අඩු කිරීම සඳහා ආයෝජනය කිරීම, ඵලදායි ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා සූදානම වර්ධනය කිරීම සහ ප්‍රතිසාධනය, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කෙරේ.

නිම කරන ලද කාර්යයන්

- ආපදා කළමනාකරණ අංශයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 31 ක් ඇගයීමට ලක් කිරීම.
- ආපදා කළමනාකරණ අංශයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් සඳහා පූර්ව නිරීක්ෂණ සැපයීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) 2026–2030 සකස් කිරීම සඳහා දායක වීම.
- ජාතික ප්‍රතිපත්ති රාමුවේ (National Policy Framework) සාරාංශය සකස් කිරීම සඳහා දායක වීම.
- ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ (Project submission format) 14 වන කොටස (ආපදා අවධානම අවම කිරීම) සඳහා මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA) සමඟ එක්ව කටයුතු කිරීම.
- ආපදා කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතනවලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- විදේශ දූතමණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම.

2.7 සමාජ ආරක්ෂණ

සමාජ ආරක්ෂණ අංශය

රජය සමාජයේ අවශ්‍යතා ඇති සහ අසරණ කොටස්වල ජීවන තත්ත්වය උසස් කිරීමට සහ ඔවුන්ට ජාතික සංවර්ධනයට දායක වීමට හැකිවන පරිදි ඉලක්කගත සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරමින් සිටී. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය, ළමුන්, අවාසි සහගත කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයන් ඇතුළු අවදානමට ලක්විය හැකි කොටස්වල යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ. ඒ අනුව මෙම කණ්ඩායම්වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට සහ ඔවුන් සමාජයට ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රේඛීය අමාත්‍යාංශ සමඟ අවශ්‍ය මැදිහත්වීම් සිදු කරයි.

2025.12.31 දිනට ප්‍රගතිය

- **ව්‍යාපෘති යෝජනා සඳහා ඇගයුම් වාර්තා සකස් කිරීම සහ කැබිනට් පත්‍රිකා වෙත නිරීක්ෂණ සකස් කිරීම**

	ලැබුණු සංඛ්‍යාව	නිර්දේශිත / ඉදිරිපත් කළ සංඛ්‍යාව
ව්‍යාපෘති යෝජනා	20	20
කැබිනට් සංදේශය සඳහා නිරීක්ෂණ	15	15
කැබිනට් සංදේශය සඳහා අදහස්	07	07

ජාතික ප්‍රතිපත්ති සැකසීම - ශ්‍රී ලංකාව සඳහා ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී.

පහත වාර්තා පිළිබඳ අදහස් ලබා දෙන ලදී;

- මානව හිමිකම් හා සමගි කිරීම සම්බන්ධ කරුණු පිළිබඳ යාවත්කාලීන කිරීම, මානව හිමිකම් මණ්ඩලයේ 58 වන සැසිය.
- දකුණු ආසියාවේ ලිංග පරිවර්තනශීලී හා සමාජීය වශයෙන් ඇතුළත් ප්‍රතිඵල ප්‍රවර්ධනය කිරීම සඳහා වන තාක්ෂණික සහාය (TA)
- මානව හිමිකම් මණ්ඩලයේ 60 වන සැසිය
- ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයන් සඳහා ජාතික ප්‍රතිපත්තිය
- එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලයේ (UNGA) 80 වන සැසිය, 2025 සැප්තැම්බර් 22–30, නිව්යෝර්ක්
- සමානාත්මතාවය හා කාන්තා සවිබලගැන්වීම පිළිබඳ කෙටුම්පත් උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම

රැස්වීම් සහ වැඩමුළු වලදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කරයි -

- සමාජ ආරක්ෂණ අංශයේ අදාළ රේඛීය ආයතන විසින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වූ අතර සමාජ ආරක්ෂණ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යෙදවුම් සපයන ලදී.

ශ්‍රමික අංශය

භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳපොළට ගෙන ඒම සඳහා පුද්ගලයෙකු විසින් කායික හා මානසික වශයෙන් දරන උත්සාහය නොහොත් ශ්‍රමය, නිෂ්පාදනයේ ඉතාම වැදගත් සාධකයක් වේ. ශ්‍රමය පිළිබඳ සැලකීමේදී, පුද්ගලයාගේ කුසලතා මට්ටම, අධ්‍යාපනය සහ ඵලදායිතාව කෙරෙහි ඇති උනන්දුව ඇඳහිය නොහැකි තරම් වැදගත් අංග වේ. එබැවින් ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව ශ්‍රමයේ ගුණාත්මකභාවය මත රඳා පවතී. ශ්‍රී ලංකාවේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් " යන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව සෑම තරාතිරමකම සේවකයින් සඳහා සමානාත්මතාවය සහ පිළිගැනීම සහතික කිරීම අරමුණු කරගනිමින්, කුසලතාවෙන් හෙබි ඵලදායි ශ්‍රම බලකායක් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථිකයේ සීඝ්‍රවත් වර්ධනයක් අත්කර ගැනීමට හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය, දැනුම සහ කුසලතාව පදනම් කරගත් ශ්‍රම බලකායක් අප රට තුල ස්ථාපිත කළ යුතුය. තවද කුසලතාවලින් පිරිපුන් ශ්‍රමිකයන් රැකියා සඳහා විදෙස්ගත කිරීම තුලින් රටේ පවතින වත්මන් ආර්ථික අර්බුදයට ධනාත්මක පිළියමක් ලබා ගැනීමට හැකිවනු ඇත. මේ තුළින් විදේශ විනිමය අර්බුදය සඳහා කෙටි කාලීන විසඳුමක් සැපයෙන

අතර, දීර්ඝ කාලීනව ඉහළ අත්දැකීම් සහ ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන් සමන්විත දක්ෂ ශ්‍රම බලකායක් මෙරට වර්ධනය වේ. විදේශ රැකියා ප්‍රවර්ධනය තුලින් විගමනික ප්‍රේෂණ වර්ධනය කර ගැනීම සඳහා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

ශ්‍රමික අංශය, කම්කරු අමාත්‍යාංශය හා විදේශ කටයුතු , විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම හා ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව ශ්‍රමික අංශය 2025 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 12 ඇගයීම් කර අදාල දෙපාර්තමේන්තු වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- කම්කරු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3 ක් සහ විදේශ කටයුතු, විදෙස් රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3 ක් සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ලබාදෙන ලදී.
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් ඇත.

2.8 ප්‍රාදේශීය සංවර්ධනය

ප්‍රාදේශීය සංවර්ධන අංශය

මෙම අංශය දිළිඳුකම පිටුදැකීම, පවතින ප්‍රාදේශීය විෂමතා අවම කිරීම, ප්‍රදේශයේ සුවිශේෂත්වය හඳුනා ගැනීම සහ සමෘද්ධිමත් ගමක් හෝ ප්‍රදේශයක් ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් එක් එක් ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ක්ෂේත්‍ර විශේෂිත ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපත්තිමය සහය මෙම අංශය විසින් ලබාදෙනු ලැබේ. එසේම, ආංශික සහ මධ්‍ය කාලීන සැලසුම්, ව්‍යාපෘති ඇගයීම සහ ව්‍යාපෘති ප්‍රමුඛතා පදනම සකස් කිරීම ආදී කටයුතු ද මෙම අංශය විසින් හසුරුවනු ලැබේ.

ඒ අනුව, ජාතික මට්ටමින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා එක් එක් පළාතේ පවතින සම්පත් ප්‍රශස්ත සහ තිරසර ලෙස භාවිත කිරීමේ වැදගත්කම මෙම අංශය මඟින් ඉස්මතු කර දක්වයි. මෙම සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගය දේශීය අරමුදල්, විදේශ ණය සහ විදේශ ආධාර ප්‍රදාන මගින් ලබාගනු ලැබේ.

මුදල් කොමිෂන් සභාව විසින් සියලුම පළාත් සභා සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මෙම අංශය විසින් අවශ්‍ය සහය / නිරීක්ෂණ ආදිය ලබාදෙයි.

තවද, , ප්‍රාදේශීය විෂමතා අඩු කරමින්, ජාතික සංවර්ධනය පෝෂණය කිරීම අරමුණු කරගෙන 2025 විමධ්‍යගත අයවැය වැඩසටහන නිර්මාණය කර ඇත. ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සහ රට පුරා සාධාරණ වර්ධනයක් වැඩිදියුණු කිරීම මගින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කොට ඇත.

2025 අයවැය යෝජනා මගින් විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 2,250ක් වෙන් කර ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක MF/02/2025 හා 2025.01.29 දිනැති චක්‍රලේඛය මගින් ලබා දෙන ලදී.

....

ප්‍ර.ග.නි./ග.නි/ආයතන ප්‍රධානි අත්සන

කේ.ටී.අයි. ප්‍රේමරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

03 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	සත්‍ය 2025 රු.	සත්‍ය 2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		220,660,454	331,902,000	ඒසීඒ-3
-	තැන්පතු		330,328	1,335,285	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම		6,024,016	4,666,870	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		227,014,798	337,904,154	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		227,014,798	337,904,154	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		44,903	39,247	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**226,969,896**	**337,864,907**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	ඒසීඒ-2(ii)
129,792,855	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	128,947,202	106,919,579	
38,856,756	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	38,066,810	33,573,039	
889,301	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	889,301	869,861	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
169,538,912	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**167,903,314**	**141,362,479**	
	මූලධන වියදම්				ඒසීඒ-2(ii)
14,223,484	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	8,334,322	-	
94,040,718	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	60,390,098	72,868,772	
5,411,361,085	ප්‍රාග්ධන මාරුකිරීම්	12	4,884,032,818	2,611,408,343	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,420,516	හැකියා වර්ධනය	14	1,576,500	556,500	
2,652,060,000	වෙනත් මූලධන වියදම්	15	2,504,639,947	1,608,548,863	
8,174,105,803	මුළු මූලධන වියදම් (උ)		**7,458,973,685**	**4,293,382,478**	
	තැන්පතු ගෙවීම්		580,645	3,420,516	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,911,855	4,853,973	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**6,492,500**	**8,274,488**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		7,633,369,499	4,443,019,445	
8,343,644,715	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(7,406,399,604)**	**(4,105,154,538)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(7,406,399,604)	(4,105,154,538)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	172,980,806	134,013,060
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	11,744,966	11,857,127
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**184,725,772**	**145,870,187**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		11,744,966	11,606,810
දේපළ පිරියත හා උපකරණ සංචිතය		172,980,806	134,013,060
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	250,317
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**184,725,772**	**145,870,187**

පිටු අංක 08 සිට 34 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 35 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම	නම : කේ.ටී.අයි.ප්‍රේමරත්න	නම : ඩබ්.එස්.පී. ද මෙල්
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 2026.02.24
දිනය : 2026.02.24	දිනය : 2026.02. 24	

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

කේ.ටී.අයි. ප්‍රේමරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

ඩබ්ලිව්.එස්.පී. ද මෙල්
ගණකාධිකාරි
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ - 01

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	4,003,105,809	2,450,182,426
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	8,878,429	6,223,144
අග්‍රිම ලැබීම්	220,660,454	331,902,000
අත්තිකාරම් අයකර ගැනීම්	6,123,312	4,027,974
තැන්පතු ලැබීම්	330,328	1,335,285
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**4,239,098,332**	**2,793,670,829**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	166,781,113	2,779,791,943
සහනාධාර සහ මාරුකිරීම්	889,301	869,861
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	4,021,168,813	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	566,523	39,247
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	44,903	3,779,060
අත්තිකාරම් ගෙවීම්	5,781,855	3,420,516
තැන්පතු ගෙවීම්	580,645	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**4,195,813,152**	**2,787,900,628**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**43,285,180**	**5,770,201**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	43,285,180	5,770,201
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**43,285,180**	**5,770,201**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(43,285,180)**	**(5,770,201)**

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - -

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	163,250,000	169,538,912	167,903,314	99.03
ප්‍රාග්ධන	6,546,000,000	8,174,105,803	7,458,973,685	91.25
මුළු එකතුව	6,709,250,000	8,343,644,715	7,626,876,999	91.41

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		අදාල නොවේ				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		33,810,000.00		
9152	වාහන		56,595,763.00		
9152	යන්ත්‍රෝපකරණ හා අනෙකුත්		38,321,562.98		
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්		44,253,480.21		
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව -

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම 1 ලෙස දක්වා ඇත.

04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන		78.57%	
අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන	97.14%		
සපයන ලද නිරීක්ෂණ ගණන	99.37%		
අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන	100%		
DCB වැඩසටහන යටතේ ව්‍යාපෘති භෞතික ප්‍රගතිය	97.84%		

05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අංශ 9 කට සහ උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශය ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශවලට යටත්ව සිදු කෙරේ. ඒ අනුව, අදාළ අමාත්‍යාංශ මගින් මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා රු. මිලියන 10 ට වැඩි සියළුම ව්‍යාපෘති වාර්තා අදාළ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. එම ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ සඳහන් වන 11 වන කාණ්ඩය අනුව යෝජිත ව්‍යාපෘති මඟින් තිරසර සංවර්ධන අරමුණු වලට දක්වන දායකත්වය පිළිබඳව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව, දර්ශක 244 කින්, ඉලක්ක 169 කින්සහ අරමුණු 17 කින් සමන්විත 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අදාළ සියළු තිරසර සංවර්ධන අරමුණු (17), ඉලක්ක සහ ප්‍රතිපත්තිමය තීරණ මෙම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඇගයීමේදී සලකා බලනු ලබයි.

තවද, තිරසර සංවර්ධන අරමුණු දැනටමත් ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇති අතර, එම අරමුණු අපගේ සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කර ගැනීම සිදු කරයි. එබැවින්, මෙම දෙපාර්තමේන්තුවට අදලව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදු කරනු නොලැබේ. ඒ අනුව, රාජ්‍ය ආයෝජන සැලැස්ම , සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබා දේ.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන සභාව සමඟ සහයෝගීත්වයෙන් සියළුම අමාත්‍යාංශ සම්බන්ධීකරණයෙන් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරයි.

ඒ අනුව, 2025 වර්ෂයේ දී මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ විෂය පථයට අයත්වන තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාළ ඉලක්ක හඳුනා ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් අදාළ මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරන ලදී. තවද එක් එක් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් විවිධ අමාත්‍යාංශ වෙතින් සිදු කරන කාර්යයන් ඇගයීම සඳහා තිරසර සංවර්ධන සභාව මඟින් සංවිධානය කරන ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වී ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	59	43	16
තෘතීයික	01	01	00
ද්විතියික	33	28	05
ප්‍රාථමික	31	26	05

06.2 ** ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහ කාර්ය සාධනය අතර සම්බන්ධතාවය.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් එක් නිලධාරියෙකුට අංශ කිහිපයක රාජකාරි ආවරණය කිරීමට සිදුවීමෙන් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට කාර්යාල වේලාවෙන් බැහැරවත් රාජකාරි ඉටුකිරීමට සිදුවෙයි.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසට හනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
Master of Arts in Economics (English Medium)	01	අවුරුදු 01	200,000		දේශීය	ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම
Public Sector Accounting Standards & Enhancing Financial Reporting in the Public Sector	01	දින 02	10,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
The Institute Of Chartered Accountants Of Sri Lanka	01	දින 01	30,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Certificate Program on ICT & Artificial Intelligence (AI)	05	දින 05	150,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම

One day workshop for Drivers	01	දින 01	6,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Office Assistant Service Duty Training Public Sector & Semi-Public Sector	02	දින 02	24,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Accounting role and Practical Application	05	දින 01	32,500		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
National Diploma in Training and Human Talent Development (NDTHTD)	01	අවුරුදු 01	100,000		දේශීය	Enhance the knowledge on official duties
Procurement Process and Practical Application (as per the new Procurement Guidelines)	03	දින 03	54,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Public Vehicle Maintenance	01	දින 01	6,500		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Adjustment of Salaries of public Servants (as per the new Salary Circular)	02	දින 01	13,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Inventory Management for Government Officials	01	දින 01	6,500		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Certificate Program in English for Office Management	03	දින 10	75,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Accounting role and Practical Application	01	දින 02	12,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම

Skill Development of Development Officers & Management Service Officers	01	දින 02	12,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Workshop on Bid Evaluation	08	දින 01	76,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Office Management and Financial Regulations	01	දින 02	12,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Role and responsibility of the Leave Officer	01	දින 01	6,500		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Writing Office notes and Official Letters	01	දින 01	6,500		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Project Management	03	දින 02	36,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Professional Development of Office Assistant and Drivers for a Quality Work Environment	02	දින 01	13,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
Capacity Development Training Program	54	දින 02	630,000		දේශීය	නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
JICA Knowledge Co-Creation Program: Capacity Building for ICT Project Planning	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Global Annual in-person Deputies Meeting of the Coalition of Finance Ministers for Climate Action	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making

A Study visit in Thailand on Implementation of Water Policy	02	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
"Study visit to Learn about the 'One Disaster Data' initiative"	01	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making
The 15th NTA Global Conference	01	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making
ITEC- Right to Adequate Housing in the Context of Habited III New Urban Agenda- Policies, Planning and Practices	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on China’s Poverty Reduction Experience under the Global Development Institute	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
Social Protection Data and Monitoring Workshop	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
V20 Climate Prosperity Fellowship Program	01	දින 13			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on Construction and Management of Development Zone for Sri Lanka	05	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on the Planning and Construction of Ports and Channels for Developing Countries	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making

Proposed Study Mission to Malaysia by Senior Treasury Officials from the Government of Sri Lanka : 26 May – 1 June, 2024 (Rescheduled : 15-22 June 2024) New Proposed Schedule : 12 - 16 May 2025	07	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on the Implementation of united Nations Forest Instrument and Sustainable Forest management for Developing Countries	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on Carbon Neutrality and Energy innovation Development in Developing Countries under the Global Development initiative	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
Regional Consultation for Review of ADB's Accountability Mechanism Policy - South Asia	01	දින 01			විදේශීය	Gained the knowledge in policy decision making
Onsite Sufficiency Economy Philosophy (SEP) Practices in Community – Based Development (CBO) , International Training Course 2025	01	දින 12			විදේශීය	Gained the knowledge in policy decision making

0612-0702 Seminar for China and B&R Countries in Cooperation of Governance Capacity	01	දින 21			විදේශීය	Gained the knowledge in policy decision making
AUSTRALIA AWARDS SOUTH ASIA & MONGOLIA Accessing Climate Finance (Regional) Short Course	01	දින 16			විදේශීය	Gained the knowledge in policy decision making
A Knowledge Exchange Event in Netherland on Green Fuels and Greening Ports	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
TA 10105-SRI: Promoting Private Sector Investment in Energy Transitions Knowledge Sharing Program on Republic of Korea's Experiences on Green Energy Transition	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
A Knowledge Exchange Event in Netherland on Green Fuels and Greening Ports	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Hand- in -Hand Investment Dialogue for Asia and the Pacific	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
2025 KOICA CIAT Training programme on Capacity Building for Government Officers on Household Economy Development for Peace Building and Social Integration in	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making

North Central Provincial Council, Sri Lanka (2024 - 2026)						
0625-0715- Seminar on Policy and Practice of Poverty Alleviation through Photovoltaic Projects for Developing Countries	01	දින 21			විදේශීය	Gained the knowledge in policy decision making
UNCTAD Conference on Green Industrialization	01	දින 02			විදේශීය	Gained the knowledge in policy decision making
Subregional Consultation Workshop on the draft SASEC Transport Sector Strategy 2035	01	දින 01			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on Renewable Energy Development and Quality - Development for Sri Lanka	01	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
Overseas Training Course on Green Development for Sri Lanka	01	දින 10			විදේශීය	Gained the knowledge in policy decision making
Workshop on Strengthening the Regional Supply and Value Chain Development for Electrical Equipment in the SASEC subregion	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
Trailblazers in Transport and Logistics : Empowering & Connecting Women Leaders	01	දින 12			විදේශීය	Gained the knowledge in policy decision making

Immersion and Learning Visit for the Empowerment Program team to the Satat Jeevikoparjan Yojana (SJY) Program by the Government of Bihar, India	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
IAEA Interregional Training Course on Establishing a National Position for a New Nuclear Power Programme	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Immersion and Learning Visit for the Empowerment Program team to the Satat Jeevikoparjan Yojana (SJY) Program by the Government of Bihar, India	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Knowledge Exchange Event in Japan on efficient and Resilient Urban Transportation	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Climate Adaptation Investment Planning Forum (CAIP2025)	01	දින 02			විදේශීය	Gained the knowledge in policy decision making
Twentieth Policy Consultation Forum of Seoul Initiative Network on Green Growth and Asia-Pacific NDC Clinic	01	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making
South-4-Care Learning Hub	01	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making

2025 Global Leadership Program	01	දින 11			විදේශීය	Gained the knowledge in policy decision making
South Asia Operations Forum	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
ADB-OECD Meeting on Healthy Agency and long-term care (LTC)	01	දින 02			විදේශීය	Gained the knowledge in policy decision making
SA 25.33- Fiscal Risk Management	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
ADB: Shanghai International Program for Development Evaluation Training (SHIPDET)	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
ADB: Shanghai International Program for Development Evaluation Training (SHIPDET)	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
2025 Asia Pacific Dialogue Platform on Anticipatory Action	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
Seminar on Public Financial Management for Sri Lanka	03	දින 14			විදේශීය	Gained the knowledge in policy decision making
South Asia Regional Training Workshop on Economic Analysis of Investment Projects	02	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making

Training Workshop on Building Resilience through Social Protection, 10-12 November 2025	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
06th Capacity Building Programme on “Clean Cities, Better Futures: Transforming Urban Sri Lanka with Regional Practices – II” for the civil Servants of Sri Lanka	01	දින 12			විදේශීය	Gained the knowledge in policy decision making
ADBI- Stanford Leadership Academy for Development : Training Program on Public Policy for Infrastructure	02	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
IMF SARTTAC training on Public Investment Management	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
South Asia Sub Regional Economic Cooperation (SASEC) Program's Working Groups Meeting and Senior Officials' Meeting	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
"Technical Deep Drive (TDD) on Cities for Tourism and Jobs" by Tokyo Development Learning Center (TDLC)	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making
Invitation to the Regional Meeting and Workshop on Unblocking Finance for Scaling up E-	01	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making

Mobility in Asia and the Pacific						
South Asia Sub Regional Economic Cooperation (SASEC) Program's Working Groups Meeting and Senior Officials' Meeting	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
World Bank - The Green and Efficient Ports - Connectivity Investment Conference	01	දින 04			විදේශීය	Gained the knowledge in policy decision making
Invitation to Join the Jobs for the Poor (J4P) Impact Program - High-Level Global Learning and Engagement Event	01	දින 03			විදේශීය	Gained the knowledge in policy decision making
Human Responses to Climate Change: Mitigation and adaptation	01	දින 19			විදේශීය	Gained the knowledge in policy decision making
South Asia Sub Regional Economic Cooperation (SASEC) Program's Working Groups Meeting and Senior Officials' Meeting	02	දින 02			විදේශීය	Gained the knowledge in policy decision making
UK Conservation learning Week	01	දින 05			විදේශීය	Gained the knowledge in policy decision making

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලිනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලිනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලිනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලිනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අදාල නොවේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	**අනුකූල වේ**		
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	**අනුකූල වේ**		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	**අනුකූල වේ**		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	**අනුකූල වේ**		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	**අනුකූල වේ**		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	**අනුකූල වේ**		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	**අනුකූල වේ**		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	**අනුකූල වේ**		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	**අනුකූල වේ**		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	**අනුකූල වේ**		

12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	**අනුකූල වේ**		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	**අනුකූල වේ**		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	**අනුකූල වේ**		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	**අනුකූල වේ**		
19	**මානව සම්පත් සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කොට තිබීම	**අනුකූල වේ**		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	**අනුකූල වේ**		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	**අනුකූල වේ**		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	**අනුකූල වේ**		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	**අනුකූල වේ**		

අවසානය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/B/NPD/25/FA

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව, පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. තවද, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 389 (අ) රෙගුලාසිය	ආදායකයාගේ අනන්‍යතාවය නිසි පරිදි තහවුරු කළහොත් මිස ඔහුට චෙක්පත් භාර නොදිය යුතු වුවත්, බාහිර ආයතනවලට ගෙවීම් කිරිමේදී එම ආයතනය විසින් ලබා දුන් ලිඛිත නියෝගයකින් තොරව වවුචරයේ මුදල් ලබා ගත් බවට අත්සන් කළ යුතු ස්ථානයේ අත්සනක් පමණක් ලබා ගනිමින් එකතුව රු 578,376ක් වටිනා චෙක්පත් 12 ක් ලබා දී තිබු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 (I)	චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශය ප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2024 ජූනි 21 දිනැති අංක 01/2024 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන සැලැස්ම අවදානම් පාදක සැලැස්මක් වන බැවින් විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන අවදානම් ලේඛණය උපයෝගී කරගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා අවදානම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

3.3 මූල්‍ය ප්‍රකාශන අකෘතීන්වල පැවති අඩු පාඩු

3.3.1 බැංකු ගිණුම් මෙහෙයවීම

මහජන බැංකුවේ පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාලව 2025 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂයක් නොමැති වුවත්, මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම (viii) හි බැංකු ගිණුම් පිළිබඳ 2025 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්තාවෙහි 2025 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව රු.44,903 ක ශේෂයක් දක්වා තිබුණි.

3.3.2 වාහන අනතුරු

2023 අගෝස්තු මස 19 දින වාහනයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම i) දක්වා නොතිබුණි.

3.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.10 ඡේදය ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා දක්වන ලද සංසන්දනාත්මක සංඛ්‍යා එම මාර්ගෝපදේශයේ 7.8 හා 7.9 ඡේද අනුව සංශෝධනය විය යුතුය. කෙසේ වෙතත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම,හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්වල එකතුව රු 2,639,515,126ක් වුවත් එම අගය ශූන්‍ය ලෙස දැක්වීමෙන් එම අගය රු 2,639,515,126ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු 140,276,817ක් වුවත්, එය රු 2,779,791,943ක් ලෙස දැක්වීමෙන් එම අගය රු 2,639,515,126ක් වැඩියෙන් දක්වා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 41 (1) වගන්තිය ප්‍රකාරව, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව සැලසුම් කර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව ක්‍රියාත්මක වන සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවලින් සමන්විත රාජ්‍ය ආයෝජන වැඩසටහනක් තිබිය යුතුය. එමෙන්ම, උක්ත පනත මඟින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇත. විගණනයට ලද තොරතුරුවලට අනුව 2025, දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයෝජන කමිටු වාර 42ක් පවත්වා තිබූ බව සඳහන් කර තිබුණ ද මෙම කමිටුව වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව, නිර්දේශ කළ ව්‍යාපෘති සංඛ්‍යාව, ප්‍රතික්ෂේප කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාල ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කළ දිනය, සමාලෝචනය සිදු කළ කාලපරිච්ඡේදය හා ප්‍රතික්ෂේප කිරීමට හේතුව යනාදි විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ 3 (ඊ) මාර්ගෝපදේශය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි.

4.2 විදේශ ආධාර ව්‍යාපෘති

(අ) මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබූ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසංවිධාන හදිසි ආධාර ව්‍යාපෘතියේ වැය විෂයයන් 03ක් සඳහා මු.රෙ 66 මඟින් රු.33,028,919ක් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර එක් වැය විෂයයකට අදාල මාරු කර ගත් ප්‍රතිපාදනවලින් සියයට 56 ක් උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන වෙළඳාම් ජාතික ආදායම්, වියදම් ක්‍රියාකාරකම්වල ඉක්මන් ප්‍රතිඵල සඳහා සහයෝගිතාවය (PARTNER) හා ශ්‍රී ලංකා මූල්‍ය අංශ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (ඕස්ට්‍රේලියානු ප්‍රදානය), යන ව්‍යාපෘති දෙකෙහි වැය විෂයයන් 3 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වටිනාකම වූ රු. 320,000,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම මු.රෙ 66 මඟින් එම ව්‍යාපෘතිවල වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. එමෙන්ම, ඉකුත් වර්ෂයේදී ද ඉහත සඳහන් වැය විෂයයන් අතුරින් අංක 237-1-1-23-2509-17 හා අංක 237-1-1-24-2202-17 යන වැය විෂයයන්වල මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි.

(ඇ) ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ 237-1-1-20-2202-12 හා 237-1-1-20-2202-0/13 (සංවර්ධන සහයන්) යන වැය විෂයයන් 2හි වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මු.රෙ 66 මඟින් වෙනත් වැය විෂයයකට ප්‍රතිපාදන මාරු කල පසුද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක් හා සියයට 76 ක් ඉතිරි වී තිබුණි.

(ඈ) ඵලදායි රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධනය ව්‍යාපෘතිය යටතේ වැය විෂයයන් 2ක් සඳහා මූලික ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන රු.57,500,000 කින් රු.14,700,531ක් වැය කිරීමකින් තොරව ඉතුරු වී තිබුණි. එම ඉතිරිය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් හා සියයට 43 ක් විය.

4.3 කළමනාකරණ දුර්වලතා

4.3.1 නිලධාරින් වෙත නිල නිවාස ලබා දීම

(i) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.14 වගන්තිය ප්‍රකාරව, රජයේ නිලධරයකුට මාරුවීම, විශ්‍රාමයාම ආදි කරුණු නිසා එම රජයේ නිවාසයේ පදිංචිවීම සඳහා ඇති සුදුසුකම අහෝසි වීම හා නිලධාරින් සමඟ දෙපාර්තමේන්තුව ඇති කර ගත් ගිවිසුමේ වගන්ති අංක 03 හා 05 ප්‍රකාරව නිල නිවාසයන්හි පදිංචිවීමට ඇති සුදුසුකම අහෝසි වූ වහාම නිවාසයන්හි පදිංචිය නිම කොට ආපසු දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවද එම සුදුසුකම අහෝසි වූ නිලධාරින් දෙදෙනෙකු එම කාල සීමාව අවසන් කිරීමෙන් පසු පිළිවෙලින් මාස 38 ක් හා මාස 54 ක් එම නිල නිවාසයන්හි රැඳී තිබුණි.

(ii) නියමිත කාලය අවසන් වී මාස 38 ක කාලයක් රැඳී සිටි නිලධාරිනියට දණ්ඩන කුළිය සහ නිල නිවසේ තක්සේරු කරන ලද වෙළඳපොළ වටිනාකම ලෙස රු.1,157,065ක මුදලක් ගෙවීමට කටයුතු කරන ලෙස දෙපාර්තමේන්තුව විසින් දැනුවත් කර තිබුණද, 2026 මැයි 20 දින වන විටත් එම මුදල ගෙවීමට නිලධාරිනිය අපොහොසත් වී තිබුණි.

(iii) අනෙක් නිලධාරිනිය ස්ථාන මාරු වී යාමෙන් පසුව දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී පැමිණි උක්ත නිලධාරිනියගේ කලත්‍රයාට, දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම් ගත වීමකින් තොරව නිල නිවාසය ලබා දී තිබුණි. ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය හා ගිවිසුම ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය දිනයේ සිට නිවාසයක පදිංචිව සිටින කාලය වෙනුවෙන් දණ්ඩන කුළියක්ද නිලධාරිනියගෙන් අයකර ගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මෙම නිලධාරියාගෙන් මාස 54 ක කාලයක් සඳහා අය විය යුතු දණ්ඩන කුළියෙන් අය කිරීමට කටයුතු කර තිබුනේ මාස 20 ක කාලයක් සඳහා පමණක් අයකරගෙන තිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

4.4.1 මූල්‍ය නොවන වත්කම්

(අ) දෙපාර්තමේන්තුව වෙත එවකට පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් ලබා දුන් Desktop පරිගණක 06 ක් සහ Miloda ආයතනය මගින් ලබා දුන් Laptop පරිගණකයක්ද, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 03 ක් ද, UPS 03 ක් ද, ටෙලිවිෂන් යන්ත්‍ර 02 ක් සහ විදුලි පංකාවක් යන වත්කම් පවරා ගැනීම සිදු කල අවස්ථාවලදී ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA –

06) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. තවද මෙම පවරාදුන් වත්කම්වල වටිනාකම තහවුරු කරගත නොහැකි විය.

(ආ) එමෙන්ම 2025 ජූනි 11 දින පැවති භාණ්ඩ වෙන්දේසියේදී ඉහත සඳහන් කළ වත්කම් රු. 55,050 ක වටිනාකමකට විකුණා තිබුණ ද එම වත්කම්වල වටිනාකම ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි (ACA – 06) සමාලෝචිත වර්ෂයේ අපහරණ වටිනාකමද අඩුවෙන් දක්වා තිබුණි. එම නිසා දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) වාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සතුව තිබූ Laptop පරිගණකයක් සහ ජනාධිපති කාර්යාලය සතුව තිබූ Apple වර්ගයේ Laptop පරිගණකයක්, (USB Mini adopter 01) ක් සමාලෝචිත වර්ෂය තුල දී දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණි. එම වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA – 06) පවරා ගැනීම් (Transfer in) ලෙස දක්වා නොතිබීමෙන් වත්කම් පවරා ගැනීම් වටිනාකම් හා වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි. තවද, මෙම වත්කම් පවරා ගැනීමේදී වත්කම්වල වටිනාකම විධිමත් ආකාරයට වාර්තා කර නොතිබුණු බැවින් එම වත්කම් වල වටිනාකම තහවුරු කර ගත නොහැකි විය.

4.4.2 වාහන උපයෝජනය

දෙපාර්තමේන්තුවට අයත් අංක මොටර් රථයක් එවකට පැවති මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය වෙත තාවකාලික පදනමින් භාර දී තිබියදී 2023.08.19 දින කොළඹ වරාය නගරය තුළදී අනතුරට ලක්වී තිබුණි. මේ සම්බන්ධයෙන් අවසාන වාර්තා ලබා දී තිබුණද, එම පරීක්ෂණ වාර්තාව මගින් විධිමත් පරිදි කරුණු අනාවරණය වී නොතිබූ බැවින් 2025 මැයි 26 දින නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. 2026 පෙබරවාරි 07 දිනැති එම පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව, අනතුරින් වාහනයට සිදුවූ හානිය රු.1,233,057ක් බවත් වාර්තාවේ දින වන විට සිදු කර තිබූ අළුත්වැඩියාවන් වෙනුවෙන් රු.291,300ක් රක්ෂණ ආයතනය මගින් ආවරණය කරගෙන ඇති බවත් තවදුරටත් අළුත්වැඩියාවන් සඳහා යන වියදම රු.941,757ක් බවත් දක්වා තිබුණි.මෙම අළුත්වැඩියා කටයුතු සඳහා වියදම රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණ කළ යුතු බවත්, අනතුර පිළිබඳ වගකිව යුතු පාර්ශවයක්, පුද්ගලයෙකු නිශ්චය කර ගත නොහැකි බවත් සඳහන් කර තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක නාමය	සේවක සංඛ්‍යාව		
	අනුමත	තත්‍ය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	59	43	16
තෘතියික මට්ටම	01	01	-
ද්විතියික මට්ටම	33	28	05
ප්‍රාථමික මට්ටම	31	26	05
එකතුව	**124**	**98**	**26**

දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21 ක් (පුරප්පාඩුව 16 සහිතව) හෙවත් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 34 කගේ දායකත්වය 2023 වර්ෂයේ සිට ලබාගැනීමට නොහැකි වී ඇත. එසේ වුවද, කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු ඇතුලු අනෙකුත් අවශ්‍යය පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය තුළදී පියවර ගෙන නොතිබුණි.

5.2 විදේශීය පුහුණු වැඩසටහන්

2025 වර්ෂයේ විදේශ ගමන් වියදම් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු 3,500,000 ක් ද, පරිපූරක ඇස්තමේන්තුව මඟින් රු.1,686,906 ක් ද සහ මු.රෙ 66 මාරු කිරීම මඟින් රු.300,585 ක් ද ඇතුළුව රු.5,487,491 ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 75ක් රාජකාරි කටයුතු සඳහා සහ පුහුණු වැඩ සටහන් වෙනුවෙන් විදේශ ගමන් චාරිකා 58කට සහභාගී වී තිබුණු අතර මේ සඳහා දරා තිබූ මුළු වියදම රු.5,487,491 ක් විය.

අංක සීඒ/1/1/16/1 හා 2010 ජුලි මස 09 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛයට අනුව රජයේ නිලධාරීන් විදේශ නිල සංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් දින 07ක් තුළ එම චක්‍ර ලේඛයේ 'ඊ' ඇමුණුමෙහි ආකෘතිය අනුව වාර්තාවක් විදේශ ගමන අනුමත කළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය. සංචාරය නිසා ඇතිවිය හැකි වාසි හා එහි දී ඉදිරිපත් වූ නව අදහස් ද, දේශීය තත්ත්වයන්ට ගැලපෙන ලෙස හැඩගස්වා ගත හැකි විදේශ ව්‍යාපෘති ආදිය පිළිබඳ සවිස්තරාත්මක කරුණු ද එම වාර්තාවට අමතර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ රාජකාරි කටයුතු සඳහා සහ පුහුණු වැඩ සටහන්වලට සහභාගී වූ නිලධාරීන් 53 දෙනෙක් විදේශ සංචාර නිමකර දිවයිනට පැමිණ මාස 01ත් මාස 11ත් අතර කාලයක් ගත වී තිබුණ ද, 2026.01.31 දින වන විටත් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

ජේ. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට